ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

பாதுகாப்பு சேவை கட்டளை மற்றும் பதவிநிலை கல்லூரி

Defence Services Command and Staff College



# වාර්ෂික වාර්තාව 2011



# வருடாந்த அறிக்கை 2011






# ANNUAL REPORT 2011

# වාර්ෂික වාර්තාව

# 2011

## පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | සේනාවිධායකගේ පණිවිඩය | iii |
| 2. | ඉතිහාසය | 1 - 2 |
| 3. | දැක්ම, මෙහෙවර සහ අරමුණ | 2 - 3 |
| 4. | මාණ්ඩලික විද්‍යාලයේ ක්‍රියාකාරකම් සංවිධාන ව්‍යුහය | 4 - 5 |
| 5. | විෂය නිර්දේශය | 6 - 7 |
| 6. | පුහුණු ක්‍රියාකාරකම් | 7 - 35 |
| 7. | පාලන සහ භාණ්ඩ කාර්ය සම්පාදනය | 36 - 43 |
| 8. | නිර්දේශ | 43 - 44 |

ඇමුණුම් :

| | | |
|---|---|---|
| අ. | ගණකාධිකාරීගේ ප්‍රකාශය | අ 1 - අ 3 |
| ආ. | අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය | ආ 1 - ආ 2 |
| ඇ. | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | ඇ 1 - ඇ 11 |
| ඈ. | විගණකාධිපති වාර්තාව | ඈ 1 - ඈ 5 |
| ඉ. | කාර්ය සාදක වාර්ථාව | ඉ 1 - ඉ 7 |
| ඊ. | මධ්‍යකාලීන සැලැස්ම | ඊ 1 - ඊ 2 |
| උ. | විගනකාධිපති වාර්තාවෙහි නිරීක්ෂණ සමතයකට පත් කිරීම | උ 1 - උ 2 |

## <u>වගු සටහන</u>

පිටු අංක


| | | |
|---|---|---|
| වගුව - 1 | පාඨමාලා අංක 5 හදාරාන ලද ශිෂ්‍ය නිලධාරි සංඛ්‍යාව | 7 |
| වගුව - 2 | පාඨමාලා අංක 5 හදාරාන ලද ශිෂ්‍ය නිලධාරන්ගේ ප්‍රතිඵලව | 7 |
| වගුව - 3 | වාහන සාරාංශය | 36 |
| වගුව - 4 | යුධ හමුදාවට අයත් වාහන විස්තරය | 37 |
| වගුව - 5 | නාවික හමුදාවට අයත් වාහන විස්තරය | 37 |
| වගුව - 6 | ගුවන් හමුදාවට අයත් වාහන විස්තරය | 37 |
| වගුව - 7 | ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබාදී ඇති වාහන විස්තරය | 38 |
| වගුව - 8 | පවරාගෙන ඇති වාහන විස්තරය | 38 |
| වගුව - 9 | ඉංජිනේරු අංශය වෙතින් සිදුකර ඇති ඉදිකිරීම් | 39 |
| වගුව - 10 | වර්ෂය තුල සිදුකර ඇති යටිතල පහසුකම් පිළිබඳ සංවර්ධනය | 43 |
| වගුව - 11 | අවසන් කිරීමට නියමිත ව්‍යාපෘති | 43 |



<u>සේනාවිධායකතුමාගේ පණිවිඩය</u>

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2011 වර්ෂය වෙනුවෙන් නිකුත් කරණු ලබන මෙම වාර්ෂික වාර්ථාව සඳහා මෙම පණිවිඩය නිකුත් කරණුයේ හද පිරි සතුටකිනි.

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය දකුණු ආසියාවේ හමුදුමය අධ්‍යන කේන්ද්‍රස්ථානයක් බවට දිනෙන් දින ළගාවනු දැකිම ඉමහත් ප්‍රිතියට කරුණකි.

2011 වර්ෂයේ විද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කරගැනිම සඳහා ලබාදුන් මිලකල නොහැකි සහය හා මගපෙන්විම සඳහා කළමණාකරණ මණ්ඩලයේ සභාපතිතුමන් හා සාමාජිකයින් වෙත මාගේ හදපිරි ප්‍රණාමය මෙම අවස්ථාවේ පුදකිරිමට කැමැත්තෙමි.

ඒ වගේම ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සියළුම නිලධාරින්ට හා සෙසුනිලයින්ටද, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශයේ සියළුම කාර්‍ය මණ්ඩලයටද, 2011 වර්ෂය අති සාර්ථක වර්ෂයක් කරගැනිමට දැක්වුවා වූ සහයෝගය වෙනුවෙන් මාගේ හද පිරි ප්‍රණාමය පුදකර සිටිමි.

ජේ සි රණූක්පොත ආර්එස්පි යූඑස්පි එන්ඩිසි පිඑස්සි අයිජි
මේජර් ජෙනරාල්
සේනාවිධායක

## වාර්ෂික වාර්තාව - 2011
## ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

### ඉතිහාසය

1. ශිෂ්‍ය නිලධාරීන් 26 දෙනෙකුගෙන් සමන්විත යුධ හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලය 1998 මාර්තු 16 වනදා ආරම්භ වුවද, විද්‍යාලය නිල වශයෙන් විවෘත කරනු ලැබුයේ එවකට යුධ හමුදාපති ලුතිතන් ජෙනරාල් ආර් ද එස් දලුවත්ත ආර්ඩබ්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් එවකට ජනාධිපතිව සිටි අතිගරු චන්ද්‍රිකා කුමාරණතුංග බණ්ඩාරනායක මැතිනිය විසින් 1998 අගෝස්තු මස 28 වන දින වේ.

2. බ්‍රිතාන්‍ය යුධ හමුදා මාණ්ඩලික විදුහලේ බ්‍රිතාන්‍ය ජාතික ලුතිතන් කර්නල් දෙදෙනෙකුගේ උපදේශකත්වයෙන් මාණ්ඩලික විද්‍යාලීය විෂයමාලාව ශ්‍රී ලංකා යුධ හමුදාවේ අවශ්‍යතාවය අනුව පිළියෙල කරන ලදී. යුහ අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ආරම්භයේදී මෙම නිලධාරීන් විසින් පුහුණු ආම්පන්න සැපයීමෙන් හා උපදේශක නිලධාරීන්ගේ උපදේශණ හැකියාවන් ප්‍රගුණ කිරීම මගින් විද්‍යාලයේ සාර්ථකත්වය සඳහා විශේෂ දායකත්වයක් ලබාදෙන ලදී.



3. තෝරාගත් යුධ හමුදා නිලධාරීන්ගේ අණ සහ මාණ්ඩලික රාජකාරීන්හි වෘත්තිය දැනුම හා අවබෝධය වර්ධනය කිරීමෙහි අරමුණින් යුහඅමාවි ආරම්භ කරන ලදී. මීට අමතරව ශ්‍රී ලංකා නාවික හා ගුවන් හමුදා නිලධාරීන් කිහිපදෙනෙකුද මෙම පාඨමාලාවට තෝරා ගත් අතර, ඔවුන්ද යුහඅමාවි පාඨමාලා අංක 1 සිට පාඨමාලාවන් හදාරන ලදී. 1998 සිට 2006 දක්වා විද්‍යාලය විසින් උපාධිධාරී නිලධාරීන් 253 දෙනෙකු බිහිකල අතර, යුධ හමුදා නිලධාරීන් 209 ක්, නාවික හමුදා නිලධාරීන් 22 ක්, ගුවන් හමුදා නිලධාරීන් 21 ක්, සහ පොලිස් නිලධාරීන් 01ක් අයෙකුද ඊට අයත් වුනි. මෙම සංඛ්‍යාව 1996 වර්ෂය වන විට ශ්‍රීලංකා යුධ හමුදාවේ සිටි මාණ්ඩලික උපාධි පාඨමාලාව හදාරන ලද නිලධාරීන් 58 දෙනාට අමතරව වේ. රටෙහි පැවති ආරක්ෂක තත්වය මත ත්‍රිවිධ හමුදා ඒකාබද්ධ පුහුණුවක අවශ්‍යතාවය දැනී තිබුණු බැවින්, මාණ්ඩලික විද්‍යාලය විසින් ත්‍රිවිධ හමුදාවන් හට එකාබද්ධ න්‍යායාත්මකව හා ප්‍රායෝගික අභ්‍යාස ලබාදීම සඳහා පියවර ගත්තා ලදී. තවද, ඒකාබද්ධ යුධ පුහුණු පරිසරයක් ඇති කිරීමෙහිලා යුධ න්‍යාය හා දර්ශනයන් නැවත සංස්කරණය කර අදට ගැලපෙන ඒකාබද්ධ පුහුණු පාඨමාලාවක් සකස් කිරීමට පෙලඹුනි.

4. වර්ෂ 2007 ක් වූ ජනවාරි 22 වන දින, ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන්ගේ වැදගත් සංධිස්ථානයක් විය. ලෝකයේ වෙනත් රටවල මෙන් ත්‍රිවිධ හමුදාවන්ට න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම සඳහා එකම ස්ථානයක් ස්ථාපිත කරනු වස්, මාණ්ඩලික විද්‍යාලය සුවිශේෂ ස්ථානයකට පත්කරන ලදී. අණ හා මාණ්ඩලික විද්‍යාලය නමින් ස්ථාපිත මෙම විද්‍යාලය ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතා විසින් නිල වශයෙන් ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ලෙස (ආසේඅමාවි) ස්ථාපිත කරන ලදී. ඊට සමගාමීව යුධ හමුදා නිලධාරී 36 දෙනෙකුගෙන්ද, නාවික හමුදා නිලධාරීන් 8 දෙනෙක් සහ ගුවන් හමුදා නිලධාරීන් 10 දෙනෙකුගෙන්ද සමන්විත ආසේඅමාවි පළමුවන පාඨමාලාව මෙදින ලියාපදිංචි කර ආරම්භ වන ලදී.







පැරණි ලාංඡනය නව ලාංඡනය

5. ග්‍රීක ඉතිහාසයේ සඳහන් පරිදි ආතර් රජුගේ පුරාවෘත්තවල පැවත එන පරිදි බස්සා ඥානය පිළිඹිබු කරන පක්ෂියා වශයෙන් හැඳින්වෙන මධ්‍ය යුගයේ එකල විසූ පූජ්‍ය පක්ෂය සහ විද්වතුනගේ දැනුම බුද්ධිය පරිනතභාවය පෙන්වන සළකුණක් වූ බස්සා බුද්ධිමතුන්ගේ ලකුණ විය.

6. රෝම පුරාවෘත්තයන්හි සඳහන් පරිදි යුද්ධය සහ ප්‍රඥාව අධිපති ලෙස මිනර්වා දෙවඟන හඳුන්වයි. ඇගේ ප්‍රියතම පක්ෂියා වී ඇත්තේ බස්සාය. බස්සා ප්‍රඥාවේ සළකුණ ලෙස සළකමින් එම පක්ෂියා විද්‍යාලයේ සළකුණ ලෙස සම්මත කරගෙන ඇත. “සිහිනුවණින් රණ දෙරණට” යන පාඨය පෙරටුකර ගෙන යුධ නාවුක හා ගුවන් හමුදා නියෝජනය කිරීම සඳහා තැඹිලි පාට වර්ණ පසුතලයක කඩු දෙකකින් ද තද නිල් පාට පසුබිමක නැංගුරමකින්ද ළා නිල් පාට පසුබිමක ඇල්බට්‍රොස් පක්ෂියාගෙන්ද බස්සා මධ්‍යයෙන් සිට ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විදුහලේ නිල ලාංඡනය පිළියෙල වී ඇත.

## <u>දැක්ම</u>

7. තෝරාගත් ත්‍රිවිධ හමුදා නිලධාරින් සහ රාජ්‍ය ආයතන වල නිලධාරින්ගේ අවබෝධය දියුණු කිරීම හා යුධ හමුදා නිලධාරින් මේජර්/ලුතිනන් කර්නල් නිලයේ තනතුරු සඳහාත්ල නාවික හමුදා නිලධාරින් ලුතිනන් කමාන්ඩර්/කමාන්ඩර් තනතුරු සඳහාත්ල ගුවන් හමුදා නිලධාරින් බලඝන නායක/වින්ග් කමාන්ඩර් තනතුරු සඳහාත්ල වෙනත් රාජ්‍ය ආයතන වල නිලධාරින් ඔවුන්ට උචිත මාණ්ඩලික තනතුරු හා පොලිස් නිලධාරින් තම ආයතන වල අණ හා මාණ්ඩලික තනතුරු සඳහා පුහුණු කිරීම විදුහලේ දැක්ම වේ.

**මෙහෙවර**

8. ත්‍රිවිධ හමුදාවෙන් තෝරාගත් නිලධාරීන් හට මාණ්ඩලික නිලධාරි දෙවන ශ්‍රේණියේ හා ඊට ඉහල තනතුරුවල රාජකාරීන් සාර්ථකව ඉටුකිරීම් වස් අවශ්‍ය දැනුම ලබාදීමටත් ඔවුන් තුල පෞද්ගලික හා වෘත්තීමය සදාචාරාත්මක සංවර්ධනයක් ඇති කිරීමටත් අණ සහ මාණ්ඩලික පත්වීම්වල ඵලදායි ලෙස කටයුතු කිරීම සඳහා හැකියාව ලබාදීමත් මෙහෙවර වේ.

9. මෙහෙවර ප්‍රකාශයට අනුව විෂය නිර්දේශය ව්‍යුවහාත්මක සංවර්ධනය වෙමින් විද්‍යාලයට කාලීනව ගැලපෙන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මේ සඳහා පහත කරුණු විශේෂ සැලකිල්ලට භාජනය වේ.

අ. බුද්ධිමය සංවර්ධනය සඳහා අධ්‍යාපනය හා අවශ්‍ය කුසලතාවයන් ලබාදීම.
ආ. පුද්ගල හා වෘත්තීය සදාචාරය හා හැකියාවන් සංවර්ධනය කිරීම.

**අරමුණු**

10. මූලික අරමුණු පහත සඳහන් පරිදි වේ.

අ. යුධ හා සාමකාමී යන අවස්ථාවන් දෙකෙහිදීම ඒ සඳහා ක්‍රියාකල යුතු ආකාරය හා ඊට අදාල ශිල්පීය ක්‍රම පිළිබඳව දැනුවත් වී සිටීම.

ආ. ඕනෑම අන්දමක යුධමය මෙහෙයුමකදී හමුදාවක අන්තර්ගත වී ඇති යුධ මූලධර්ම හා ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුවත් වීම හා ඒ තුලින් ඒකාබද්ධව හෝ තනිව ක්‍රියා කිරීම.

ඇ. යුධ හමුදා සේනාංකයක හෝ නාවික හා ගුවන් හමුදාවල ඊට සමාන මට්ටමේ අණදීමේ යාන්ත්‍රණයේ ක්‍රියාකාරකම් පිළිබඳ විග්‍රහය.


ඈ. ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවන්හි ව්‍යුහය, සංවර්ධනය භූමිකාව සහ අන්තර් යැපීම පිළිබඳව දැනුවත් වීම.

ඉ. ශ්‍රී ලංකාවේ ආරක්ෂක ප්‍රතිපත්තිය සකස් වී ඇති ආකාරය සහ යුධ හමුදා දර්ශනය ඊට සම්බන්ධ වී ඇති අයුරු අවබෝධ කර ගැනීම.

ඊ. ශ්‍රී ලංකාවේ හා මිත්‍ර රටවල ආරක්ෂක ප්‍රතිපත්ති වලට බලපෑම් ඇති කරනු ලබන ජාතික හා ජාත්‍යන්තර කරුණු පිළිබඳව විග්‍රහය.

<u>**මාණ්ඩලික විද්‍යාලයේ ක්‍රියාකාරකම් හා සංවිධාන ව්‍යූහය**</u>

11. **සංවිධානය**. ආසේඅමාවි සංවිධාන ව්‍යූහය - MOD/CSCB/4/(75) 24 February දරණ ලිපිය යටතේ කළමණාකරණ සමිතිය මගින් අනුමත කර ඇත.



12. **ක්‍රියාකාරිත්වය.** මාණ්ඩලික විදුහලේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා එයට පැවරි ඇති කාර්යභාරය පහත පරිදි වේ.

අ. සන්නද්ධ හමුදා වල නිලධාරින් මාණ්ඩලික විද්‍යාලයේ අධ්‍යාපන පාඨමාලාව සඳහා බඳවා ගැනීම.

ආ. පොලිස් දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකාවෙන් පිටත හමුදාමය සංවිධාන වල සාමාජිකයින් විද්‍යාලීය පාඨමාලාව හැදෑරීම සඳහා ඇතුලත් කර ගැනීම.

ඇ. විද්‍යාලයේ අධ්‍යයන මණ්ඩලය තීරණය කරන පරිදි ආරක්ෂාව සහ යුධ කළමණාකරණය පිළිබඳව හැදෑරීම සඳහා රාජ්‍ය නිලධාරින් හට මුදල් ගෙවා පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දීම .

ඈ. ඉහත 'අ' 'ආ' සහ 'ඇ' ඡේද වල සඳහන් පරිදි එම නිලධාරින් ලබාගත් කුසලතාවය සහ ප්‍රවීනතාවය ඇගයීම සඳහා විභාග පැවැත්වීම.

13. **කළමණාකරණ මණ්ඩලය.** මාණ්ඩලික විද්‍යාලයේ කළමණාකරණ සහ පරිපාලන කටයුතු සඳහා පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත කළමණාකරණ මණ්ඩලයට බලය පැවරි ඇති අතර, එම මණ්ඩලය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යතුමා විසින් පත්කර ඇත.

අ. ආරක්ෂක ලේකම් - සභාපති.
ආ. අතිරේක ලේකම් (ආරක්ෂක).
ඇ. භාණ්ඩාගාර ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයෙකු.
ඈ. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි.
ඉ. යුධ හමුදාපති.
ඊ. නාවික හමුදාපති.
උ. ගුවන් හමුදාපති.
ඌ. කැලණි විශ්ව විද්‍යාලයේ උපකුලපති.
එ. මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක.
ඒ. ආසේඅමාවි බ්‍රිගේඩියර් සම්බන්ධීකරණ (ලේකම්).

14. කළමණාකරණ මණ්ඩල රැස්වීම විද්‍යාලයේ පාඨමාලා පුහුණුව ඉහළ නැංවීම සඳහා මෙන්ම විදුහලේ යටිතල පහසුකම් නැංවීම සඳහා 2011 වර්ෂයේ දෙවරක් පවත්වනු ලැබිය.

15. **විද්‍යාලීය අධ්‍යයන මණ්ඩලය.** විද්‍යාලයේ අධ්‍යන කටයුතු සහ ආරක්ෂක අධ්‍යාපන කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා පහත සඳහන් අධ්‍යන මණ්ඩලය පත්කර ඇත.

අ. ආසේඅමාවි සේනාවිධායක.
ආ. කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති.
ඇ. කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි අංශයේ පීඨාධිපති.
ඈ. ආසේඅමාවි බ්‍රිගේඩියර් සම්බන්ධිකරණ.
ඉ. යුධ හමුදා ප්‍රධාන උපදේශක.
ඊ. නාවික හමුදාවේ ප්‍රධාන උපදේශක.
උ. ගුවන් හමුදාවේ ප්‍රධාන උපදේශක.
ඌ. ආසේඅමාවි ප්‍රධාන මාණ්ඩලික නිලධාරි 1 - ලේකම්.

**<u>විෂය නිර්දේශය</u>**

16. පාඨමාලාව සති **3** ක ආරම්භක සැසිවාරයකින්ද, අධ්‍යාපන කාර්තු 4 කින්ද සමන්විත වේ.

17. **<u>පළමුවන වාරය - මූලික අධ්‍යනය (සති12)</u>** . මෙය 2011 ජනවාරි 24 දින ආරම්භකරන ලද අතර 2011 අප්‍රේල් 8 දින නිමවිනි. පහත විෂයන් මෙම කාර්තුව තුල ආවරණය විය.

අ. හමුදාවන් හි විවිධ අංශ.

ආ. සංග්‍රාමික සේවා ආධාර.

ඇ. අණ දීම, අණ දීමේ සහය සහ තීරණ ගැනීම.

ඈ. දර්ශනය, ක්‍රියාන්විත හා සටන් කටයුත.

ඉ. බුද්ධිමය මාණ්ඩලික රාජකාරි.

ඊ. ප්‍රධාන හා හඨ කාර්ය සම්පාදන මාණ්ඩලික රාජකාරි.

උ. හට කාර්ය සම්පාදන මාණ්ඩලික රාජකාරි.

ඌ. යුධ ක්‍රියාන්විතයන්.

එ. පර්යේෂණ ක්‍රමවේදයන්.

ඒ. ශ්‍රී ලාංකීය අධ්‍යාපනය.

18. **<u>දෙවන වාරය - යුධ ක්‍රියාන්විතයන් (සති 13)</u>**. මෙය 2011 අප්‍රේල් 18 සිට 2011 ජූලි 14 දක්වා පැවැත්වෙන ආවරණය වූ විෂය කොටස් මෙසේය.

අ. ගුවන් සටන් ක්‍රම.

ආ. සිවිල් අධිකාරින් වෙත හමුදා ආධාර.

ඇ. යුධ ක්‍රියාන්විතයන්.

ඈ. උපක්‍රමික අධ්‍යයන.

ඉ. ජාත්‍යන්තර සම්බන්ධතා.

ඊ. විදේශ අධ්‍යාපන චාරිකාව.

19. **<u>තුන්වන වාරය - යුධ කටයුතුවලට අමතර ක්‍රියාන්විත (සති 13)</u>**. මෙම පාඨමාලාව 2011 ජූලි 28 සිට 2011 ඔක්තෝබර් 14 දක්වා පැවැත් විය. පහත විෂය කොටස් මේ යටතේ ආවරණය විය.

අ. ප්‍රති ත්‍රස්තවාදි ක්‍රියාන්විත මෙහෙයුම්.

ආ. කළමණාකරණය.

ඇ. නාවික සටන් ක්‍රම.

ඈ. උපක්‍රමික අධ්‍යයන.

ඉ. ජාත්‍යන්තර සම්බන්ධතා.

ඊ. ජාත්‍යන්තර මානව නීතිය පිලිබඳව වැඩ මුළුව.

උ. ඒකාබද්ධ මෙහෙයුම.

20. **<u>හතරවන වාරය - කළමණාකරණය හා තාක්ෂණය (සති 9)</u>**. මෙම කාර්තුව 2011 ඔක්තෝබර් 19 සිට 2011 දෙසැම්බර් 15 දක්වා පැවැත් විය. පහත විෂයන් මෙහිදී ආවරණය කෙරුණි.

- අ. කළමණාකරණය.
- ආ. යුධ තාක්ෂණය.
- ඇ. එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම්.
- ඈ. ක්‍රියාන්විත සඳහා පුහුණු වීම්.
- ඉ. ආරක්ෂාව.
- ඊ. පරිපාලනය.
- උ. න්‍යෂ්ඨික, ජීව විද්‍යාත්මක හා රසායන යුධ කටයුතු.

## <u>ආසේඅමාවි පාඨමාලා 5 පුහුණු ක්‍රියාකාරකම්</u>

21. ආසේඅමාවි පාඨමාලාව හැදෑරූ ශිෂ්‍ය නිලධාරින් සංඛ්‍යාව පහත පරිදි වේ.

| යුධහමුදා | නාවික | ගුවන් | විදෙස් | මුළු බලකාය |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 48 | 13 | 14 | 8 | 83 |

වගුව - 1

වගුව -1

22. පාඨමාලාව හැදෑරූ විදෙශ් ශිෂ්‍ය නිලධාරින් පහත පරිදි වේ.

- අ. බංගලාදේශය - 2
- ආ. චීනය - 1
- ඇ. ඉන්දියාව - 1
- ඈ. මාලදිවයින - 1
- ඉ. නේපාලය - 1
- ඊ. පකිස්ථානය - 1
- උ. සූඩානය - 1

23. <u>ප්‍රතිඵල</u>. 2012 ජනවාරි 18 දින පවත්වනු ලැබූ 16 වන කළමණාකාර රැස්වීමේදී අනුමත කර ආසේඅමාවි පාඨමාලා අංක 5 ට අදාළ ප්‍රතිඵල නිකුත් කෙරුණි. එහි සාරාංශය පහත පරිදි වේ.

| හමුදා අංශය | අවසාන කාර්තුවේදී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | ලබා ගත් | පාඨමාලාව හැදෑරූ වර්ෂය | තම ඒකකය වෙත හරවා යැවූ චිනය නීති | MDS ආරක්ෂක සේවා පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ගත් |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| යුධහමුදාව | 56 | 53 | 01 | - | 26 |
| නාවිකහමුදාව | 13 | 13 | - | - | 05 |
| ගුවන්හමුදාව | 14 | 14 | - | - | 12 |
| එකතුව | 83 | 82 | 01 | - | 43 |

වගුව -2

24. ආසේඅමාවි පාඨමාලාව 05 අනුමත අධ්‍යන විෂය නිර්දේශය අනුව මෙහෙයවන ලදි. පාඨමාලාව මෙහෙයවීම, මෙහෙයවීම නිළධාරින් හා සුදුසුකම් ලත් කථිකාචාර්යවරුන් සතර දෙනෙකු විසින් ආරක්ෂක සේවා පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවට අදාලව පවත්වන ලදි. මීට අමතරව ශිෂ්‍ය නිළධාරින්ගේ දැනුමේ නිම්වළලු පුළුල් කරනු වස් ඔවුන්ව විවිධ වැදගත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙතද, විදෙස් සංචාර සඳහාද, සහභාගි කරවන ලදි. මෙම ක්‍රියාකාරකම් ශිෂ්‍ය නිළධාරින්ගේ උපක්‍රමික හා තාක්ෂණික ඥානය හා සැබැදි ආරක්ෂක ක්‍රියාන්විතයන්හිදි ඉංජිංනේරු ආධාර සැළසුම්කරණය, සේනාංකය/බලසේනාආවරණය විය.

25. ආසේඅමාවි පාඨමාලා 05 අධ්‍යයන වාර 4කින් යුක්ත වූ අතර, පහත සඳහන් පුහුණු ක්‍රියාකාරකම් වලින් සමන්විත වන ලදි.

අ. <u>පලවන වාරයේදී පවත්වන ලද අභ්‍යාස</u>.

(1) <u>යුධ හමුදා අංශය</u>.

(අ) <u>**හෝල්ඩ් ෆාස්ට් අභ්‍යාසය.**</u> මෙම අභ්‍යාසය 2011 ජනවාරි 31 දින යුධ හමුදා ශිෂ්‍ය නිළධාරින් විසින් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලද අතර, මෙහි අරමුණ වූයේ ආරක්ෂක ක්‍රියාන්විතයන්හිදි ඉංජිනේරු ආධාර, සේනාංකය/බලසේනා මට්ටමින් සැළසුම්කරණය පිළිබඳ අවබෝධයක් ලබා දීමයි.



(ආ) <u>**පැන්ඩෝරා බොක්ස් අභ්‍යාසය.**</u> මෙම අභ්‍යාසය 2011 ජනවාරි 15 වන දින යුධ හමුදා ශිෂ්‍ය නිළධාරින් විසින් විද්‍යාල පරිශ්‍රයේදි පවත්වන ලදි. සංක්ෂිප්ත වාර්ථාවක් පිළියෙල කිරිම මෙම අභ්‍යාසයේ අරමුණ වේ.



(ඇ) **<u>මාස්ටර් රයිටර් අභ්‍යාසය.</u>** මෙම අභ්‍යාසය 2011 පෙබරවාරි 24 දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර, එමගින් රාජකාරි සේවා ලිපි ලිවීම සැබැඳිව ඇති නීති පිළිබඳ නිවැරදි හා මනා පුහුණුවක් ලබාදෙන ලදී.



(ඈ) **<u>කැරවැන් අභ්‍යාසය.</u>** මෙම අභ්‍යාසය 2011 මාර්තු 9 වන දින යුධ හමුදා ශිෂ්‍ය නිලධාරීන් විසින් විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලද අතර, එමගින් ශිෂ්‍ය නිලධාරීන්ට උපක්‍රමශීලීව ක්‍රියාත්මකයන්ට පෙර මාර්ග සංචාරය සම්බන්ධ මාණ්ඩලික පුහුණුවක් හා සැලසුම්කරණ දැනුම ලබාදීම අරමුණ විය.



(ඉ) **<u>බ්‍රාස් ටැක් අභ්‍යාසය.</u>** මෙම අභ්‍යාසය ගම්පහ අස්ගිරි රජමහා විහාර ප්‍රදේශයේදී 2011 අප්‍රේල් මස 2 දින පවත්වන ලදී. සේනාංක/බලසේනා සංකල්පය මත සිට ආරක්ෂාව පිළිබඳ සැලසුම්කරණය පිළිබඳ පුහුණු ලබාදීම අරමුණ විය.



(ඊ) **තන්ඩර් බෝල්ට් අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2011 අප්‍රේල් මස 25 වන දින විද්‍යාල භූමියේදි පවත්වන ලද අතර, ප්‍රහාරයකදි වෙඩි බලය සැලසුම්කරණය පිළිබඳ අවබෝධය ලබාදෙන ලදි.



**(2) නාවික හමුදා අංශය.**

(අ) **කීලර් වේල් අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2011 ජනවාරි මස 25 වන දින විද්‍යාල පරිශ්‍රයේදි නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් විසින් පවත්වන ලදි. මෙහි අරමුණ වුයේ නියත තීරණ හා නිර්දේශ ගනු පිණිස කරුණු මත ඉදිරිපත් කිරිම හා කරුණු ගොනු කිරිමේ කුසලතා ශිෂ්‍ය නිලධාරින් තුළ ඇති කිරිමයි.



(ආ) **ලෙෆ්ට් හුක් අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2011 ජනවාරි මස 27 වන දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදි පවත්වන ලද අතර, අරමුණ වුයේ දිර්ඝ අවිධිමත්ව ලියන ලද ලිපි වලින් එම විෂය පිළිබඳ ප්‍රධාන කරුණු උකහා ගනිමින් සංවිධානාත්මකව සාරාංශ ගත කිරිමේ හැකියාව සංවර්ධනය කිරිමයි.



(ඇ) **<u>වර්බල් ඩී අභ්‍යාසය.</u>** මෙම අභ්‍යාසය 2011 ජනවාරි මස 31 වන දින විද්‍යාල භූමියේදී නාවික හමුදා නිලධාරින් විසින් පවත්වන ලදි. මෙහිදි ශිෂ්‍ය නිලධාරින්ට පෙර පුහුණු නොවූ කථා පැවැත්විමේ අභ්‍යාසය සිදු කරන ලදි. පෙර පුහුණු නොවූ කථා, එම මොහොතේ පැවැත්විම තුලින් ඔවුන්ට තමන්ගේ මතකයන් හා විෂය දැනුම සභාවක පැහැදිලිව ඉදිරිපත් කිරිමේ කුසලතාවය වර්ධනය කෙරේ.



(ඈ) **<u>ස්මෝක් ස්ටැක් අභ්‍යාසය.</u>** මෙය 2011 පෙබරවාරි මස 14 දින ශිෂ්‍යනිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදි පවත්වන ලදි. මෙහිදි සංකිර්ණ තත්වයන් සඳහා රූපමය ක්‍රියාදාමයන් ඔස්සේ විසඳුම් සෙවිමට යොමුකරන ලදි.



**(3)** **<u>ගුවන් හමුදා අංශය</u>**.

(අ) **<u>විද්වත් කථා අභ්‍යාසය</u>**. මෙය 2011 මාර්තු මස 19 දින ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල භූමියේදි පවත්වන ලද්දේ ඔවුන් හට ලියවිල්ලක් නිවැරදිව සැකසීමකින් යුක්තව ඉදිරිපත් කිරිමේ හැකියාව වර්ධනය කරනු පිණිසය.



(ආ) **ගුවන් පහර අභ්‍යාසය**. මෙය 2011 මාර්තු මස 28 වන දින සිට මාර්තු මස 29 දක්වා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් උදෙසා විද්‍යාල පරිශ්‍රයේදි පවත්වන ලද්දේ තනි පුද්ගල අභ්‍යාස පුහුණු කිරීමේ අභිප්‍රාය ඇතිවය.



(4) **ත්‍රිවිධ හමුදා ඒකාබද්ධ අභ්‍යාසය.**

(අ) **රවුන්ඩ් ටේබල් අභ්‍යාසය.** මෙය 2011 මාර්තු මස 15 දින සියළු ශිෂ්‍ය නිලධාරින් උදෙසා විද්‍යාල පරිශ්‍රයේදි පැවැත්විණි. සාකච්ඡා සටහන් ලිවිමේ කුසලතාවය වර්ධන කිරිම අරමුණ විය.



ආ. **දෙවන වාරයේ පවත්වන ලද අභ්‍යාස**.

(1) **යුධ හමුදා අංශය**.

(අ) **අපර් කට් අභ්‍යාසය.** මෙම අභ්‍යාසය 2011 මැයි 5 දින සිට 9 දින දක්වා යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් නාරම්මල ප්‍රදේශයේ පැවැත්විණි. එහි අරමුණ වූයේ බලසේනා මට්ටමින් ප්‍රහාරාත්මක ක්‍රියාන්විත සැලසුම් පුහුණු කිරිම වේ.



(ආ) **<u>ෂයිනින් ආමර් අභ්‍යාසය.</u>** මෙම අභ්‍යාසය 2011 මැයි මස **30** දින විද්‍යාල පරිශ්‍රයේදී යුධ හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් පවත්වන ලදි. අරමුණ වුයේ ක්‍රියාන්විත නියෝග සැබැදි අභ්‍යාස කිරිමය.



(ඇ) **<u>කැරියර් පිජන් අභ්‍යාසය</u>**. මෙම අභ්‍යාසය **2011** ජූලි මස **4** සිට **9** වන දින දක්වා විද්‍යාල භූමියේදී හමුදා ශිෂ්‍ය නිලධාරින් උදෙසා පවත්වන ලදි. මෙහි අරමුණ වුයේ යුධ න්‍යාය තුල සේනාංක මට්ටමේ ප්‍රහාරාත්මක හා ආරක්ෂාකාරි මෙහෙයුම් සමගින් උපක්‍රමික යුධ ක්‍රියා පිළිබඳ දැනුමක් ලබා දීමයි.



**(2)** <u>නාවික අංශය</u>.

(අ) **<u>යුලයිසිස් අභ්‍යාසය.</u>** මෙය **2011** අප්‍රේල් මස **29** දින වන දින නාවික හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදී පැවැත් වු අතර, එහි අරමුණ වුයේ ක්‍රියාන්විත සැළසුම් ක්‍රියාදාමයේදී නායකත්වයේ වැදගත්කම පිළිබඳ ඔවුන් වෙත අවධාරණය කිරිමයි.



(ආ) **<u>තන්ඩර් ස්ට්‍රයික් අභ්‍යාසය.</u>** මෙම අභ්‍යාසය 2011 අප්‍රේල් මස 29 දින නාවික හමුදා ශිෂ්‍ය නිළධාරින් සඳහා විද්‍යාල පරිශ්‍රයේදි පැවතුන අතර, එහි අරමුණ වූයේ ශිෂ්‍ය නිළධාරින්ගේ සාහිත්‍ය පරිශීලනය තුලින් පර්යේෂණ හැකියාව වර්ධනය, න්‍යායාත්මක දැනුම ග්‍රහණය හා විවිධ අවස්ථාවලට අනුක්‍රමිකව ක්‍රියාවට නැංවීමේ හැකියාවත් ඔප්නැංවීමයි.



(ඇ) **<u>කොන්ටිකි අභ්‍යාසය.</u>** මෙය 2011 ජූනි මස 24 දින සිට 26 දින දක්වා නාවික හමුදා ශිෂ්‍ය නිළධාරින් වෙනුවෙන් අවිස්සාවේල්ල හා හංවැල්ල ප්‍රදේශයේදී පැවැත්විනි. මෙම අභ්‍යාසය පැවැත්වූයේ ශිෂ්‍ය නිළධාරින් තුල නායකත්ව කුසලතා, නිර්මාණශිලිත්වය හා වෘත්තීය නිපුණතාවය ඇති කරනු වස් අභියෝගාත්මක ක්‍රියාකාරකම් සැළසුම් කිරිමේ වටපිටාවක ඔවුන්ගේ ආත්ම ශක්තිය ඉහළ නැංවීමේ අභිප්‍රායෙනි.




(ඈ) **<u>ට්‍රයිඩන්ට් අභ්‍යාසය.</u>** මෙය 2011 ජූලි මස 4 දින සිට 7 වන දින දක්වා නාවික හමුදා ශිෂ්‍ය නිළධාරින් වෙනුවෙන් විද්‍යාල භූමියේදි පවත්වන ලදි. මෙහි අභිප්‍රාය වූයේ ක්‍රියාන්විත සැලැස්ම පිළිබඳ පුහුණුවක් ලබාදිමයි.

(ඉ) **<u>මැන් ඔෆ් වොර් අභ්‍යාසය.</u>** මෙම අභ්‍යාසය 2011 ජූලි මස 8 දින නාවික හමුදා ශිෂ්‍ය නිළධාරින් පවත්වන ලදි. මෙහිදි තාර්කික තෝරා ගැනිම් හා නව අත්පත්කර ගැනිම් වෙනුවෙන් වන පර්යේෂණ දත්ත හා සැලසුම් පටිපාටිය, තම චින්තන ක්‍රියාවලිය තුලින් සේවා අවශ්‍යතා දියුණුවට යොමු කිරිම පිළිබඳ අවධානය යොමු කරන ලදි.



**(3) ඒකාබද්ධ අභ්‍යාසයන්.**

(අ) **ඔක්ටොපස් අභ්‍යාසය.** මෙය 2011 මැයි මස 12 සිට 13 වන දින දක්වා නාවික හා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් විද්‍යාල පරිශ්‍රයේදි පවත්වන ලදි. අරමුණ වූයේ ජලජ ක්‍රියාවට හා ගුවන් ක්‍රියාන්විතයන් සැළසුම්කරණය හා ක්‍රියාවට නැංවීම පිළිබඳ අභ්‍යාසයන් ලබාදිමයි.



(ආ) **කොන්ක්‍රිට් ජන්ගල් අභ්‍යාසය.** මෙය 2011.05.23 දින සිට 2011.05.28 දින දක්වා යුධ හමුදා හා ගුවන් හමුදා ශිෂ්‍ය නිලධාරින් වෙනුවෙන් කුරුණැගල ඇතුගල ප්‍රදේශයේදි පවත්වන ලදි. අරමුණ වූයේ ප්‍රහාරක හා ආරක්ෂාකාරි මෙහෙයුම් බලසේනා මට්ටමින් නාගරික පරිසරයකදි සැළසුම්කරණය පිළිබඳ අවබෝධය ලබා දීමයි.



(ඇ) **ගෝල්ඩන් ශිල්ඩ් අභ්‍යාසය.** මෙය 2011.06.06. දින සිට 2011.06.12 දින දක්වා ත්‍රිවිධ හමුදා නිලධාරින් වෙනුවෙන් ගලේවල දඹුල්ල හා නාවුල ප්‍රදේශයන්හිදි පවත්වන ලදි. අරමුණ වූයේ සේනාංක හා බලසේනා මට්ටමේ ආරක්ෂාකාරි මෙහෙයුම් වලදී තීරණ ගැනීමේ හැකියාව සහ ගුවන් බලය යෙදවීම පිළිබඳ පුහුණුවක් ශිෂ්‍ය නිලධාරින්ට ලබා දීමය.



(ඈ) <u>**ෂැඩෝ ඩාන්ස් අභ්‍යාසය.**</u> මෙය 2011.06.27 දින සිට 2011.06.30 දින දක්වා යුධ හමුදා හා ගුවන් හමුදා නිලධාරීන් වෙනුවෙන් විද්‍යාලීය භූමියේදී පවත්වන ලදී. මෙහි අරමුණු වූයේ යුධ සැළසුම් පරික්ෂා කිරීමේ ක්‍රම වේදයක් (War Game) මගින් සැළසුම් තහවුරු කර ගැනීම.සහ සේනාංක මට්ටමේ ඒකාබද්ධ මෙහෙයුම් සැළසුම් කිරීම පුහුණු කිරීමයි.



ඇ. <u>**තුන්වන වාරයේ පවත් වන ලද අභ්‍යාස**</u>.

(1) <u>**යුධ හමුදා අංශය**</u>.

(අ) <u>**පිල් බොක්ස් අභ්‍යාසය.**</u> යුධ හමුදා නිළධාරීන් වෙනුවෙන් 2011.08.18 වන දින විද්‍යාලීය පරිශ්‍රයේදී පැවැත්විණි. මෙහි අරමුණ වූයේ ආරක්පක මෙහෙයුම් වලදී බලසේනා මට්ටමේ ප්‍රති ත්‍රස්තවාදි ආරක්පක සැළසුම් සකස් කිරීමයි.



(ආ) <u>**ඉන්ක් බෝල්ට් අභ්‍යාසය.**</u> 2011.09.01 දින සිට 2011.09.06 දින දක්වා යුධ හමුදා ශිෂ්‍ය නිළධාරීන් වෙනුවෙන් විද්‍යාල භූමියේදී පවත්වන ලදී. මෙහි අරමුණ වූයේ සේනාංකයක මට්ටමේ ප්‍රථි ත්‍රස්ථවාධි ක්‍රියාන්විත සඳහා හඨ පිරිස් යෙදවීමේ සැලසුම් කිරීම පිළිබඳ අවබෝධයක් ලබා දීම.



**(2)** <u>**නාවික හමුදා අංශය**</u>.

(අ) <u>**කොනොප්ස් අභ්‍යාසය.**</u> 2011 දෙසැම්බර් මස 5 සහ 6 දින වලද නාවික ශිෂ්‍ය නිළධාරින් සදහා මෙම අභ්‍යාසය විද්‍යාල පරිශ්‍රය තුළ පවත්වන ලදි. යුධ මූලධර්ම සැලකිල්ලට ගෙන ක්‍රියාන්විතයක් අධ්‍යනය කර එමගින් උගත් පාඩම් පිළිබඳව විශ්ලේෂණය කිරීම මෙමගින් බලාපොරොත්තු වේ.




(ආ) <u>**සී ලයන් අභ්‍යාසය.**</u> 2011 සැප්තැම්බර් මස 16 වන දින විද්‍යාල පරිශ්‍රයේදී මෙම අභ්‍යාසය පැවැත් වූ අතර, නාවික ක්‍රියාන්විත පිළිවෙත් වල වර්ථමාන හා අනාගත යුධ මෙහෙයුම් හි ප්‍රධාන සංකල්ප ප්‍රතිපත්ති හා ගැටලු පිළිබඳව ඉගැන්වීම මෙමගින් බලාපොරොත්තු වේ.



**(3)** **<u>ඒකාබද්ධ අභ්‍යාසය</u>**.

(අ) **<u>ස්ලේජ් හැමර</u>**[7]. මෙම අභ්‍යාසය 2011 සැප්තැම්බර් මස 25 සිට 30 දක්වා යුධ හා ගුවන් ශිෂ්‍ය නිලධාරින් විසින් ඒකාබද්ධව විදුහලේදී සිදු කරනු ලැබිය. මෙම අභ්‍යාසය මගින් ක්‍රියාන්විත යුධ සැලසුම් කිරිම හා ක්‍රියාත්මක කිරිමේ පුහුණුව ලබා දෙන අතර, එමගින්

i. ක්‍රියාන්විත/උපක්‍රමික මට්ටමේ ප්‍රතිප්‍රස්තික ක්‍රියා පිළිවෙත් අභ්‍යාසය.

ii. ප්‍රතිප්‍රස්තික ක්‍රියා පිළිවෙත් සඳහා ආරක්ෂිත යුධ සැලසුම් පිළිබඳව අධ්‍යනය.

iii. යුධ අභ්‍යාස ක්‍රිඩා මෙහෙයවිම තුළින් අධ්‍යයනය ලබා දිම සිදු කෙරේ.



(ආ) **<u>ඒකාබද්ධ යුධ සැලසුම් පැකේජය</u>**. ඒකාබද්ධ යුධ සැලසුම් පැකේජය 2011 සැප්තැම්බර් මස 20 සිට 23 දක්වා දින වලදි බංගලාදේශ අණ හා මාන්ඩලික විද්‍යාලයේ ත්‍රිවිධ හමුදා උපදේශකයින් විසින් විදුහලේදි පවත්වන්නට යෙදුනි.



(ඇ) **<u>මැග්නම් ෆෝස් යුධ අභ්‍යාසය</u>**. මෙය 2011 ඔක්තෝබර් මස 3 සිට 7 දක්වා විදුහල් භුමියේදි පවත්වන ලද අතර, මෙය මාණ්ඩලික යුධ උපක්‍රමික ක්‍රියාදාමයන්හි මාණ්ඩලික නිලධාරියෙකු තිසි තිරණ ගැනිම සහ විවිධ සැලසුම් ක්‍රියාත්මක කිරිම උදෙසා පුහුණුවක් ලබා දිම අරමුණු කරගෙන සිදු කෙරේ.



ඇ. **<u>හතරවන වාරයේදී පවත් වන ලද අභ්‍යාස</u>**.

(1) **<u>යුධ හමුදා අංශය</u>**.

(අ) **<u>ගයිඩින් ලයිට් අභ්‍යාසය</u>**. යුධ හමුදා පුහුණු ප්‍රතිපත්ති වලට අනුව බලසේනා පුහුණු උපදේශකයෙකු ලෙස



(ආ) **<u>ගෝස්ට් වෝක් අභ්‍යාසය</u>**. මෙම අභ්‍යාසය 2011 දෙසැම්බර් මස 07 වන දින වැලිවේරිය පුගොඩ සහ කිරදිවැල යන ප්‍රදේශයන්හිදි යුධ හමුදා ශිෂ්‍ය නිළධාරින් විසින් සිදු කරන ලදි. යුධ ක්‍රමෝපායන් පිළිබඳව හට පිරිස් රහිතව ලිඛිතව බල ඇණි මට්ටමින් සිදු කරනු ලබන මෙම අභයාසය යුධ මුලධර්ම මත පිහිටා බල ඇණි මට්ටමින් සිදු කරනු ලබන අභ්‍යාසයකි.



**(2)** **<u>නාවික හමුදා අංශය</u>**.

(අ) **<u>සලමැන්ඩර් අභ්‍යාසය</u>**. මෙය 2011 නොවැම්බර් මස 18 වන දින නාවික ශිෂ්‍ය නිළධාරින් විසින් විද්‍යාල භූමියේදි සිදු කරන ලද අතර ශිෂ්‍ය නිළධාරින් හට ඒකාබද්ධ යුධ සැළසුම් කිරිම සඳහා පුහුණුවක් ලබාදෙන ලදි.



**(3) ගුවන් අංශය.**

(අ) **දඩු මොණරා අභ්‍යාසය**. මෙම අභ්‍යාසය ගුවන් ශිෂ්‍ය නිළධාරින් විසින් විදුහල් භූමියේදි සිදු කරන ලද අතර එමගින් තමන් සතු ලේඛණ ගත දැනුම උපයෝගි කරගෙන යුධ ඇගයිමක් තක්සේරුවක් කිරිම සිදු කරයි.



**(4) ඒකාබද්ධ අභ්‍යාසය.**

(අ) **කෘෂිබල් අභ්‍යාසය**. 2011 නොවැම්බර් මස 17 ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිළධාරින්ගේ සහභාගිත්වයෙන් විදුහල් භූමියේදි සිදු කරන ලදි. මහජන අවශ්‍යතාවයන් සහ මෙහෙයුම් සඳහා ත්‍රිවිධ හමුදා කැඳවනු ලැබූ විට එම ක්‍රියාවන් සඳහා සැළසුම් කිරිම මෙහෙයුම් ක්‍රියාත්මක කිරිම සඳහා ඒකාබද්ධ පුහුණුවක් ලබා දිම මෙහි අරමුණ වේ.



(ආ) **පර්පල් ටර්ටල් අභයාසය**. මෙම අභයාසය 2011 නොවැම්බර් 24 සිට 27 දක්වා කාලය තුල ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය නිළධාරින්ගේ සහභාගිත්වයෙන් විදුහලේදි පැවැත්විණ. දිය සහ ගොඩ යන උභය මෙහෙයුම් සඳහා පුහුනුවක් ලබාදිම මෙහි අරමුණයි.



ඉ. **<u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (1 වාරය) පරීක්ෂණ</u>**.

(1) **<u>යුධ හමුදා අංශය.</u>**

(අ) ‘මාස්ටර් රයිටර්’ නැමැති අභ්‍යාසය 2011 පෙබරවාරි 24 දින පවත්වන ලදි.

(ආ) ‘රවුන්ඩ් ටේබල්’ නැමැති අභ්‍යාසය 2011 මාර්තු මස 15 වන දින පවත්වන ලදි.

(2) **<u>නාවික හමුදා අංශය.</u>**

(අ) ‘රවුන්ඩ් ටේබල්’ නැමැති අභ්‍යාසය 2011 මාර්තු 15 දින පවත්වන ලදි.
(ආ) ‘ස්මෝක්ස්ටැක්’ නැමැති අභ්‍යාසය 2011 මාර්තු මස 15 වන දින පවත්වන ලදි.

(3) **<u>ගුවන් හමුදා අංශය.</u>**

(අ) ‘පෙන් ඩ්‍රයිවර්’ නැමැති අභයාසය 2011 පෙබරවාරි 24 දින පවත්වන ලදි.
(ආ) ‘ඇල්බැට්‍රස්’ නැමැති අභයාසය 2011 මාර්තු මස 15 වන දින පවත්වන ලදි.

ඊ. **<u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (2 වාරය) පරීක්ෂණ</u>**

(1) **<u>යුධ හමුදා අංශය.</u>**

(අ) ‘අපර් කට්’ නැමැති අභ්‍යාසය 2011 මැයි 16 දින පවත්වන ලදි.
(ආ) ‘ගෝල්ඩන් ෂීල්ඩ්’ නැමැති අභ්‍යාසය 2011 ජුනි මස 11 වන දින පවත්වන ලදි.
(ඇ) ‘පැඩෝ ඩාන්ස්’ නැමැති අභ්‍යාසය 2011 ජුනි මස 30 වන දින පවත්වන ලදි.

(2) **<u>නාවික හමුදා අංශය.</u>**

(අ) ජාත්‍යන්තර සමුද්‍ර නීතිය විභාගය 2011 ජුනි මස 23 දින පවත්වන ලදි.
(ආ) ‘යුලිෂිස්’ ක්‍රියාන්විත අභ්‍යාසය 2011 අප්‍රේල් මස 29 වන දින පවත්වන ලදි.

(3) **<u>ගුවන් හමුදා අංශය.</u>**

(අ) ‘එයාර් ඩිටර්න්ස්’ නැමැති අභ්‍යාසය 2011 මැයි 29 දින පවත්වන ලදි.
(ආ) ‘ගෝල්ඩන් ෆිල්ඩ්’ නැමැති අභ්‍යාසය 2011 ජුනි මස 11 වන දින පවත්වන ලදි.

උ. **<u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (3 වාරය) පරීක්ෂණ.</u>**

(1) **<u>යුධ හමුදා අංශය.</u>**

(අ) 'ඉන්ක් බ්ලොට්' අභ්‍යාසය 2011 සැප්තැම්බර් මස 06 වන දින පවත්වන ලදි.

(ආ) 'ස්ලෙජ් හැමර්' අභ්‍යාසය 2011 ඔක්තෝබර් මස 01වන දින පවත්වන ලදි.

(2) **<u>නාවික හමුදා අංශය.</u>**

(අ) 'කොනොප්ස්' නාවික අභ්‍යාසය 2011 සැප්තැම්බර් මස 06 වන දින පවත්වන ලදි.

(ආ) 'කිලර්වේල්' නාවික අභ්‍යාසය 2011 අගෝස්තු මස 27 වන දින පවත්වන ලදි.

(3) **<u>ගුවන් හමුදා අංශය.</u>**

(අ) ස්ලෙජ් හැමර් අභ්‍යාසය 2011 ඔක්තෝබර් මස 01 වන දින පවත්වන ලදි.

ඌ. **<u>රෙඩ් ඉන්ක් කරෙක්ෂන් (4 වාරය) පරීක්ෂණ.</u>**

(1) **<u>යුධ නාවික ගුවන් හමුදා අංශ.</u>**

(අ) සේනාවිධායක පර්යේෂණ කෘති ඉදිරිපත් කිරිම 2011 ඔක්තෝබර් 03 වන දින භාරදිම.

**26.** සියලුම ශිෂ්‍ය නිලධරින් සඳහා ආරක්ෂක උපාධි පාඨමාලාවේ අධ්‍යන විෂයන් සඳහා පහත සඳහන් විභාග පවත්වන ලදි.

අ. **<u>දෙවන වාරය.</u>**

(1) ශ්‍රීලාංකිය ඉතිහාසය /දේශපාලන/සමාජිය/ආර්ථික සඳහා අධ්‍යන විභාගය 2011 ජූලි මස 07 වන දින පවත්වන ලදි.

(2) අන්තර් ජාතික කටයුතු පිළිබඳව විභාගය 2011 අගෝස්තු 2 පවත්වන ලදි.

ආ. **<u>තුන්වන වාරය.</u>**

(1) ක්‍රම උපාය අධ්‍යන විභාගය 2011 සැප්තැම්බර් මස 22 පවත්වන ලදි.

ඇ. **<u>හතරවන වාරය.</u>**

(1) කළමණාකරණ අධ්‍යන විභාගය 2011 නොවැම්බර් මස 09 පවත්වන ලදි.

**27**. **ඉදිරිපත් කිරීම්**. පාඨමාලා අංක 06 ශිෂ්‍ය නිලධාරින් විසින් පාඨමාලා කාලය තුළදි පහත සඳහන් මාතෘකා යටතේ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදි.

අ. **1 වන වාරය**.

(1) **අණ හා පාලන අධ්‍යන පිළිබඳව ඉදිරිපත් කිරීම් (යුධ අංශය).**

(අ) ජෙනරාල් ඩේවිඩ් හොවල් පෙට්‍රියස් (ඇ.එ.ජ)
(ආ) මහා ඇල්පිඩ් (එක්සත් රාජධානිය)
(ඇ) ජෙනරල් ජෝර්ජ් වොෂින්ටන් ( ඇ.එ.ජ )
(ඈ) වෝන්ල් පර්වේස් මුසාරප් (පකිස්ථානය)
(ඉ) ජෙනරල් ඕමාන් එන් බැඩ්ලි ( ඇ.එ.ජ )
(ඊ) ජෙනරල් යුලිසිස් එස් ග්‍රාන්ට් ( ඇ.එ.ජ)
(උ) ශ්‍රීමත් ජෙනරල් වෝල්ටර් රොබට් ටේම්පර් (එක්සත් රාජධානිය)
(ඌ) ෆීල්ඩ් මාපල් මොහොමඩ් අයුබ් ඛාන් (පකිස්ථානය)
(එ) ජෙනරල් මුස්ථාපා කෙමල් (තුර්කිය)
(ඒ) කිම් ජෝන් - ඉල් (උතුරු කොරියාව)

(2) <u>අණ හා පාලන අධ්‍යන පිළිබඳව ඉදිරිපත් කිරිම නාවික අංශය (නාවික අංශය)</u>.

(අ) අද්මිරල් ශ්‍රීමත් ජේම්ස් ෆෝවන්ස් සමර්විල්
(ආ) අද්මිරල් කා(ර්)ල් ඩොනිට්ස්

(3) <u>අණ හා පාලන අධ්‍යන පිළිබඳව ඉදිරිපත් කිරිම ගුවන් අංශය (ගුවන් අංශය)</u>.

(අ) ජෙනරල් ලෙප්ටිනන්ට් ඇඩොල්(ප්) ජෝපප් ෆඩිනන්ඩ් ගැලන්ඩ්
(ආ) එයා මාපල් අස්ගාර් ඛාන්
(ඇ) ජෙනරල් හොයිට් සැන්ෆර්ඩ් වෙන්ඩෙන්ඩර්ග්
(ඈ) එයා චීෆ් මාපල් ශ්‍රීමත් ට්‍රැෆෝඩ් ලීග් මැලෝයි
(ඉ) එයා මාපල් හග් කාස්වල් ට්‍රිමන්තියර් බවුඩින්
(ඊ) ජෙනරල් ජෝර්ජ් සී කෙනඩ්



ආ. **<u>දෙවන වාරය</u>.**

(1) <u>සංග්‍රාම අධ්‍යයන ඉදිරිපත් කිරීම යුධ අංශය</u>.

(අ) මිච(ර්)ලෝඩ් මෙහෙයුම (ධචැර්එසදබ ද ධඩැරකද්‍ා–
(ආ) බර්ලින් සංග්‍රාමය
(ඇ) සටැලින්ග්‍රාඩ් යුද්ධය
(ඈ) ප්‍රංශ සංග්‍රාමය
(ඉ) ඉන්දු පකිස්ථාන යුද්ධය 1965
(ඊ) මිස්වේ යුද්ධය
(උ) ටුනීෂියා ව්‍යාපාරය
(ඌ) ඉරාන ඉරාක යුද්ධය
(එ) මොස්කව් යුද්ධය
(ඒ) පෝලන්ත ආක්‍රමණය

(2) <u>සංග්‍රාම අධ්‍යයන ඉදිරිපත් කිරීම (ජරැැබඑ්එසදබ) නාවික අංශය</u>.

(අ) රිවර් ප්ලේට්හි යුද්ධය
(ආ) සුසිමි යුද්ධය

(3) <u>සංග්‍රාම අධ්‍යයන ඉදිරිපත් කිරීම (Presentation) ගුවන් අංශය</u>.

(අ) කාගිල් හි මෙහෙයුම
(ආ) විරස්ථායි නිදහස නැමැති මෙහෙයුම



ඇ. **<u>3 වන වාරය</u>.**

(1) <u>ඓතිහාසික සිද්ධි අධ්‍යයන ඉදිරිපත් කිරීම (ඒකාබද්ධ)</u>.

(අ) කියුබානු විප්ලවය
(ආ) මින්ඩානෝ හදිසි අවස්ථාව
(ඇ) නැගෙනහිර ටිමෝරය
(ඈ) වියට්නාම් ගැටුම
(ඉ) ප(ර්)වියන් හදිසි අවස්ථාව
(ඊ) චීන විප්ලවය
(උ) ඩාෆ් ව්‍යාපාරය

ඈ. **<u>4 වන වාරය</u>.**

(1) <u>ශ්‍රී ලංකා ඒකාබද්ධ මෙහෙයුම් - සිද්ධි අධ්‍යයන ඉදිරිපත් කිරීම (ඒකාබද්ධ)</u>.

(අ) බලවේග මෙහෙයුම
(ආ) රිවිරැස මෙහෙයුම

(ඇ) ජයසිකුරු මෙහෙයුම
(ඈ) අග්නිකීල මෙහෙයුම
(ඉ) කිනිහිර මෙහෙයුම



**28**. <u>**වාරිකා**</u>. වැදගත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන පිළිබඳ ශිෂ්‍ය නිලධාරින්ගේ දැනුම පුළුල් කිරීමේ අරමුණින් විවිධ ආයතන වලට නැරඹීම සහ අධ්‍යයන වාරිකා පිළියෙල කර ඇත මීට අමතරව ඉන්දියාව, ඉන්දුනීසියාව පාකිස්ථානය සහ මැලේසියාව යන රටවල් වල දින 10 ක විදේශ අධ්‍යයන වාරිකා යෙදීමට ශිෂ්‍ය නිලධාරින්ට අවස්ථාව උදා වෙන ලදි.

අ. <u>**1 වන වාරය.**</u>

(1) **HMAS මෙල්බෝ(ර්)න් වාරිකාව 2011 ජනවාරි 26 දින.**



(2) **මිනින්දෝරු දෙපාර්තමේන්තුව වාරිකාව 2011 පෙබරවාරි 3 දින.**



**(3) කොළඹ මහාධිකරණ අධ්‍යයන වාරිකාව නාවික ශිෂ්‍ය නිලධාරින් විසින් 2011 මාර්තු 3 වන දින සිදු කරන ලදි.**

ආ. **<u>2 වන වාරය.</u>**

(1) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සහ කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර 2011 මැයි 7 වන දින ශිෂ්‍ය නිළධාරින් විසින් චාරිකාවක යෙදෙන ලදි.



(2) 2011 ජුනි 12 සීගිරිය ඓතිහාසික භූමිය අධ්‍යයනයක යෙදෙන ලදි.



(3) 2011 ජුලි 11 දින නාරා (NARA) ජාතික ජලජ සම්පත් ගවේෂන හා සංවර්ධන ඒජන්සිය සහ කාලගුණ දෙපාර්තමේන්තුව නැරඹීමේ චාරිකාවක යෙදෙන ලදි.



(4) දින 10 ක විදේශීය හමුදාමය ආයතන වල අධ්‍යයන චාරිකාවක් ඉන්දුනීසියාව, පකිස්ථානය, මැලේසියාව ඉන්දියාව යන රටවල 2011 ජූලි 14 දින සිට 25 දින දක්වා යෙදුනි.











ඇ. **<u>3 වන වාරය.</u>**

(1) නාවික ශිෂ්‍ය නිලධාරීන් විසින් කොළඹ මහ බැංකුව 2011 අගෝස්තු 18 වන දින චාරිකාවක යෙදෙන ලදි.



(2) 2011 සැප්තැම්බර්15 වන දින බටහිර නාවික විධානය, වරාය අධිකාරිය සහ කොළඹ ඩොක්යාර්ඩ් ආයතනය ශිෂ්‍ය නිලධාරින් විසින් චාරිකාවක යෙදෙන ලදි.



ඈ. <u>**4 වන වාරය.**</u>

(1) 2011 ඔක්තෝම්බර් 20 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නරඹන ලදි.

(2) 2011 දෙසැම්බර් 2 දින ආරක්ෂක අමාත්‍යාංශයේ චාරිකාවක යෙදෙන ලදි.




(3) බියගම ආයෝජන මණ්ඩලය 2011 නොවැම්බර් 14 දින චාරිකාවක යෙදෙන ලදි.



## 29. විශේෂ අවස්ථා.

අ. **විදේශ දූත කණ්ඩායම් වල චාරිකා**. පහත සඳහන් විදේශ දූත කණ්ඩායම් ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ චාරිකාවන්හි යෙදෙන ලදි.

(1) පකිස්ථානු යුධ හමුදා ප්‍රධානි ජෙනරල් අෂ්රෆ් පා(ර්)වේෂ් කයානි හපෘඑ– 2011 ජනවාරි 1 දින විද්‍යාලයේ චාරිකාවක යෙදුනි.



(2) බංගලාදේශ යුධ හමුදා ප්‍රධානි M D අබ්දුල් මුදීන් ndc, psc 2011 පෙබරවාරි 27 දින විදුහල් චාරිකාවක යෙදුනි.



(3) පකිස්ථානු හමුදාවේ ලුතිතන් ජෙනරල් මුජාමිල් හුසෙයින් HI (M), IGT & E 2011 මාර්තු 8 වන දින විදුහල් චාරිකාවක යෙදුනි.



(4) පකිස්ථාන නාවික මණ්ඩලික පාඨමාලා අංක 40 නිලධාරින් පිරිසක් 2011 මාර්තු 10 දින විදුහලේ වාරිකාවක යෙදෙන ලදි.



(5) 2011 ඔක්තෝම්බර් 12 වන දින චිනයේ ජාතික ආරක්ෂක අමාත්‍යාංශ කාර්යාලයේ ප්‍රධානි මේජර් ජනරාල් ක්වැන් ලිහියුආ 2011 ඔක්තෝම්බර් 12 දින විදුහල් වාරිකාවක යෙදෙන ලදි.



ආ. **<u>ජ්‍යෙෂ්ඨ හමුදා ප්‍රධානින්ගේ වාරිකා</u>**. පහත සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරින් ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයෙහි 2011 වර්ෂයේ වාරිකාවන්හි යෙදෙන ලදි.

(1) ගුවන් හමුදාපති තුමා 2011 නොවැම්බර් 21 දින විද්‍යාලයේ වාරිකාවක යෙදෙන ලදි.



(2) යුධ හමුදාපති තුමා 2011 නොවැම්බර් 29 දින විද්‍යාලයේ චාරිකාවක යෙදෙන ලදි.



(3) නාවික හමුදාපති තුමා 2011 නොවැම්බර් 29 දින විද්‍යාලයේ චාරිකාවක යෙදෙන ලදි.



(4) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි තුමා 2011 දෙසැම්බර් 12 දින විද්‍යාලයේ නිරීක්ෂණ චාරිකාවක යෙදෙන ලදි.



ඇ. <u>**අධ්‍යාපනික වැඩසටහන්**</u>. පහත සඳහන් අධ්‍යාපනික වැඩ සටහන් 2011 වර්ෂයේ තුළදී ආරක්ෂක විද්‍යාලයේදී පවත්වන ලදි.

(1) ඒකාබද්ධ යුධ අභ්‍යාසය පිළිබඳ වැඩමුළුව 2011 සැප්තැම්බර් 23 දින බංගලාදේශ මිරිපූර් හි හමුදා නිළධාරින් විසින් සිදු කරන ලදි.



(2) ජාත්‍යන්තර මානව නීති පිළිබඳ වැඩ මුළුව ජාත්‍යන්තර රතු කුරුස සංගමයේ නිළධාරින් විසින් 2011 අගෝස්තු 26 දින පවත්වන ලදි.

(3) ජේන්ස් සගරාවේ බළධාරින් විසින් පවත්වන ලද දේශණය.

(4) අධ්‍යාත්මික දියුණුව සම්බන්ධයෙන් ජයලාල් රෝහන මහතා විසින් 2011 ජුලි 20 දින දේශණයක් පවත්වන ලදි.

ඉ. <u>**උපාධි ප්‍රධානෝත්සවය**</u>. ආසේඅමාවි පාඨමාලා අංක 5 උපාධි ප්‍රධානෝත්සවය 2011 දෙසැම්බර් 14 දින විද්‍යාලීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විනි. ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු දි මු ජයරත්න මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා වූ අතර, ආරක්ෂක ලේකම් ගරු ගෝඨාභය රාජපක්ෂ මහතා, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි ත්‍රිවිධ හමුදාපතිවරු සහ තවත් විශේෂිත ආරාධිත අමුත්තන් මේ සඳහා සහභාගි විය.ආසේඅමාවි පාඨමාලා අංක 05 ත්‍යාග හිමිකරගත් ජයග්‍රාහීන් පහත පරිදි වේ.



(1) <u>**ලබාගත් ලකුණු අනුව පළමු ස්ථානය (යුධ හමුදා අංශය).**</u>
මේජර් KS මද්දුමගේ (ශ්‍රීලංකා සබුබ)

(2) <u>**ලබාගත් ලකුණු අනුව පළමු ස්ථානය (නාවික හමුදා අංශය).**</u>
ලුතිනන් කොමාණ්ඩර් U P කරවිට

(3) <u>**ලබාගත් ලකුණු අනුව පළමු ස්ථානය (ගුවන් අංශය).**</u>
වින්ග් කොමාණ්ඩර් SPVK සේනාධීර RSP

(4) <u>**ස්වර්නමය පන්හිඳණී ත්‍යාගය.**</u>
හොඳම සේනාවිධායක නිබන්ධනය ඉදිරිපත් කිරීම වෙනුවෙන් ත්‍යාගය වින්ග් කමාණ්ඩර් SPVK සේනාධීර RSP විසින් ජයග්‍රහනය කරන ලදි

ඊ. **උපාධි ප්‍රධානෝත්සවයේ රාත්‍රී සාදය**. 2011 දෙසැම්බර් 14 වන දින උපාධි ප්‍රධානෝත්සවය වෙනුවෙන් පැවැත්වෙන රාත්‍රී භෝජන සංග්‍රහය කොළඹ ජෙට් ලයිනර් නෞකාවේදී පවත්වන ලදි.



**30**. **විදුහලේ වෙනත් සමාජීය ක්‍රියාකාරකම්**. පහත සඳහන් ක්‍රියාකාරකම් විදුහල තුළ 2011 වර්ෂයේදී පැවැත්විනි.

අ. අන්තර් කණ්ඩායම් ක්‍රිකට් තරගාවලිය 2011 පෙබරවාරි 12 දින විදුහල් භූමියේදී පැවැත්විනි.



ආ. විද්‍යාලීය "හැප්රන්" ක්‍රියාකාරකම 2011 සැප්තැම්බර් 10 දින නිළධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.



ඇ. විද්‍යාලීය "පැන්ටොමයිම්" ක්‍රියාකාරකම නිළධාරීන්ගේ රංගන කුසලතා එළි දැක්වීම සඳහා 2011 දෙසැම්බර් මස 9 වන දින විදුහල් භූමියේදී පවත්වන ලදි.



ඇ. වාර්ෂික සුහද චාරිකාව 2011 ඔක්තෝම්බර් මස 28 දින කුකුලේගඟ යුධ හමුදා නිවාඩු නිකේතනයේදී පවත්වන ලදි.



ඉ. විදුහලේ කටයුතු සඳහා නිරන්තර දායකත්වයක් දෙන නිලධාරින් සහ සිවිල් විද්වතුන් උදෙසා පැවැත්වෙන අමුත්තන්ගේ රාත්‍රිය (GUSI NIGHT) 2011 සැප්තැම්බර් **23** වන දින විදුහල් භූමියේදී පවත්වන ලදි.



ඊ. සිංහල අලුත් අවුරුද්ද 2011 අප්‍රියෙල් 07 වන දින විදුහල් භූමියේදී සියලු නිලධාරින් සහ සෙසු නිලයින්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.



31. **<u>කාන්තා සමාජය</u>**. විද්‍යාලීය කාන්තා සමාජයේ සමාරම්භක උත්සවය 2011 පෙබරවාරි 11 දින සියලුම නිලධාරින්ගේ භාර්යාවන්ගේ සහභාගීත්වයෙන් ආරම්භ විය. එකිනෙකාගේ දැනුම බෙදා ගැනීම සහ ත්‍රිවිධ හමුදා නිලධාරි භාර්යාවන් අතර සුහදත්වය වර්ධනය උදෙසා මෙම කාන්තා සමාජය පැවැත්වෙන අතර, 2011 වර්ෂය පුරා පැවති විවිධ වැඩ සටහන් පහත පරිදි වේ.

අ. වෙසක් බැති ගී වැඩසටහන 2011 මැයි 06



ආ. ජෙනට් නිෂ්පාදන ආයතනය විසින් 2011 ජූලි 13 දින රූප ලාවන්‍ය වැඩ සටහනක් පවත්වන ලදි.

ඇ. විදේශීය ශිෂ්‍ය නිලධාරින්ගේ භාර්යාවන් විසින් සූපවේදි වැඩසටහනක් 2011 සැප්තැම්බර් 23 වන දින පවත්වන ලදි.

ඈ. 'කාන්තා රාත්‍රිය' විවිධ විනෝදකාමී වැඩසටහන් සමගින් 2011 ඔක්තෝබර් මස 14 වන දින විදුහල් භූමියේදි පවත්වන ලදි.



ඇ. කාන්තා උපන්දින උත්සව වරින්වර පවත්වන ලදි.

ඉ. 2011 දෙසැම්බර් මස 09 වන දින කුඩා ළමුන් සඳහා නත්තල් උත්සවයක් පවත්වන ලදි.



## පාලන සහ හට කාර්ය සම්පාදනය

**32**. **පාලන හා හට කාර්ය සම්පාදන අංශය**. විද්‍යාලයේ කාර්යක්‍ෂම පැවැත්ම සඳහා අවශ්‍ය සියලුම සේවා හා පහසුකම් විදුහල වෙත ඉල්ලීම සහ ලබා දීම මෙම අංශයේ ප්‍රධාන අරමුණ වේ. කාර්යක්‍ෂම ඵලදායී සේවාවක් ලබා දීම සඳහා පහත සඳහන් අංශ පාලන සහ හට කාර්ය සම්පාදන අංශය යටතේ ක්‍රියාත්මක වේ.

අ. ප්‍රසම්පාදන අංශය
ආ. ලැබීම් පොළ
ඇ. ප්‍රවාහන අංශය
ඈ. නිලධාරි නිවස්නය
ඉ. බත්/සැර නිවාසය
ඊ. කෝප්‍රල් සමාජය
උ. සෙසු නිල භෝජනාගාරය
ඌ. හට නිවාස අංශය
එ. ඉංජිනේරු සේවා රෙජිමේන්තුව
ඒ. වෛද්‍ය මධ්‍යස්ථානය

**33**. **ඉහත අංශයන් මගින් 2011 වර්ෂය තුළදී ක්‍රියාත්මක වූ සේවාවන් පිළිබඳව විස්තර.**

අ. ප්‍රසම්පාදන අංශය - මෙම අංශය මගින් විදුහලට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් නියමිත ප්‍රසම්පාදන නිතිරීති අනුව භාණ්ඩ හා සේවාවන් ලබා ගන්නා අතර මේ සියලු කටයුතු මූල්‍ය රෙගුලාසි අනුව සිදු කෙරේ. 2011 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු පහත පරිදි වේ.

(1) ඉංජිනේරු උපකරණ මිළදී ගැනීම.
(2) බැරැක්ක උපකරණ මිළදී ගැනීම.
(3) ජායාස්ථ පිටපත් යන්ත්‍ර/ පරිගණක ශීතකරණ අමතර කොටස් මිළදී ගැනීම.
(4) ප්‍රවාහන අංශය සඳහාඅමතර කොටස් මිළදී ගැනීම.
(5) ප්‍රවාහන සේවා සහ අලුත්වැඩියාව.
(6) දේශණ ශාස්ත්‍ර සම්භාෂණ හා සැරසිලි වියදම්.
(7) ලිපිද්‍රව්‍ය මිළදී ගැනීම්.
(8) ක්‍රීඩා භාණ්ඩ මිළදී ගැනීම.
(9) අලුතින් පවරා ගන්නා ලද ඉඩම් සඳහා මිනින්දෝරු සැලැස්ම පිළියෙල කිරීම.
(10) මුද්‍රණය.

ආ. **ලැබීම් පොළ.** ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කර ගන්නා ලද සියලු භාණ්ඩ නිසි පරිදි ලියාපදිංචි කර ඉන්වෙන්ට්‍රි ගත කර ඒ සියලු භාණ්ඩ සේනාවිධායකගේ අනුමැතියකින් පසු හටනිවාස ගබඩාව වෙත නිකුත් කරයි.

ඇ. **ප්‍රවාහන අංශය.**

| යුධහමුදා | නාවික | ගුවන් | ආරක්ෂක අමාත්‍යාංශයේ | කුලී පදනම මත |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 20 | 02 | 02 | 17 | 03 |

**වගුව -3**

(1) විදුහලේ ප්‍රවාහන අංශය සතුව වාහක රුසක් ඇති අතර පහත සඳහන් වාහන ආරක්ෂක අමාත්‍යාංශය මගින් 2011 වර්ෂයේදී විදුහල වෙත ලබා දී ඇත .

NB – 1012 (අශෝක් ලේලන්ඩ් බස්)
PC – 5484 (ටාටා කැබ්ස්)

(2) <u>ආසේඅමාවි සතුව ඇති වාහන විස්තර</u>.

(අ) <u>යුධ හමුදාව සතුව ඇති වාහන</u>.

| අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | යුහ 261138 | ටොයොටා කෝස්ටර් බස් රථය |
| 2. | යුහ 26141 | ටොයොටා කෝස්ටර් බස් රථය |
| 3. | යුහ 4299 | ඉසුසු බස් රථය |
| 4. | යුහ 7436 | ටාටා 1612 ට්‍රක් රථය |
| 5. | යුහ 23080 | ටාටා එස්ඩී 13 x 13 ට්‍රක් රථය |
| 6. | යුහ 4138 | ට්‍රෙප් ට්‍රක් රථය |
| 7. | යුහ 7287 | නිසාන් සනි කාර් රථය |
| 8. | යුහ 7250 | නිසාන් සනි කාර් රථය |
| 9. | යුහ 7293 | නිසාන් සනි කාර් රථය |
| 10. | යුහ 4841 | ටෝයොටා ලෑන්ඩ් කෲසර් 3 ජීප් රථය |
| 11. | යුහ 18048 | ලෑන්ඩ් රෝවර් මාක් 3 ජීප් රථය |
| 12. | යුහ 21504 | මිස්සුබිෂි එල් 300 වෑන් රථය |
| 13. | යුහ 19072 | ඉසුසු බඩල් කැබ් රථය |
| 14. | යුහ 2181 | ටොයොටා බඩල් කැබ් රථය |
| 15. | යුහ 19039 | මිස්සුබිෂි එල් 300 බඩල් කැබ් රථය |
| 16. | යුහ 10410 | යමහ මෝටර් බයික් |
| 17. | යුහ 2790 | යමහ ඩිටි මෝටර් බයික් |
| 18. | යුහ 10621 | හිරෝ ස්ට්‍රිම් මෝටර් බයික් |
| 19. | යුහ 4424 | |
| 20. | යුහ 9022 | |

**වගුව -4**

(ආ) <u>නාවුක හමුදාව සතුව ඇති වාහන</u>.

| අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | නාහ 5597 | නිසාන් සිවිලියන් බස් රථය |
| 2. | නාහ 6024 | ටොයොටා වෑන් රථය |

**වගුව -5**

(ඇ) <u>ගුවන් හමුදාව සතුව ඇති වාහන</u>.

| අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | ජී 3627 | රෝසා බස් රථය |
| 2. | ජී 3703 | ලංකා අශෝක් ලේලන්ඩ් |

**වගුව -6**

(ඇ) <u>ආරක්ෂක අමාත්‍යයන්ශය විසින් සපයා ඇති වාහන.</u>

| අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | කේඑෆ් 3471 | නිසාන් සනි කාර් රථය |
| 2. | කේඑෆ් 3697 | නිසාන් සනි කාර් රථය |
| 3. | එල්ඊ 8419 | මිත්සුබිසි සින්ගල් කැබ් රථය |
| 4. | එල්ඊ 8420 | මිත්සුබිසි සින්ගල් කැබ් රථය |
| 5. | එන්ජී 5801 | මිස්ත්‍ර්පුබිෂි එල් 300 වෑන් රථය |
| 6. | එන්ජී 7343 | ෆූසො බස් රථය |
| 7. | ආර්ජී 8869 | ට්‍රැක්ටර් රථය |
| 8. | ටීඑස් 1409 | යමහ 106 මෝටර් බයික් |
| 9. | ටීඑස් 1404 | යමහ 106 මෝටර් බයික් |
| 10. | ටීඑස් 1414 | යමහ 106 මෝටර් බයික් |
| 11. | ටීඑස් 1419 | යමහ 106 මෝටර් බයික් |
| 12. | බියූඑම් 5327 | බජාජ් ත්‍රී වීලර් |
| 13. | එල්එෆ් 3072 | ටාටා ඩබල් බවුසර් |
| 14. | පිසි 5484 | ටාටා ඩබල් කැබ් |
| 15. | එන්බී 1012 | අශෝක් ලේලන්ඩ් බස් රථය |
| 16. | ඩබ්පිකේආර් 8591 | සුසුකි මරුටි කාර් රථය |
| 17. | ඩබ්පිකේආර් 8614 | සුසුකි මරුටි කාර් රථය |

**වගුව -7**

| අංකය | වාහන අංකය | වාහන වර්ගය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | ජීඑෆ් 1171 | ටොයෝටා කාර් රථය |
| 2. | ජීඊ 7098 | ටොයෝටා කාර් රථය |
| 3. | එච්ජේ 9664 | ටොයෝටා කාර් රථය |

**වගුව -8**

ඇ. **<u>නිලධාරි නිවස්නය</u>**. අදාල වශයෙන් නිලධාරීන් 151 දෙනෙකු (ශිෂ්‍ය නිලධාරීන්83 උපදේශක හා නිත්‍ය කාර්ය නිලධාරීන් 60 දෙනෙකු සහ විදේශීය ශිෂ්‍ය නිලධාරීන් 08 දෙනෙකු සඳහා අවශ්‍ය භෝජනාගාර පහසුකම් 2011 වර්ෂයේදී උසස් අන්දමින් සපයා ඇත. උපාධි ප්‍රධානෝත්සවයට පෙර නිලධාරි නිවස්නයේ විවේකාගාර ගොඩනැගිල්ල පිළිසකර කිරීම සහ තිර රෙදි දැමීම සිදු කරන ලදී.

ඉ. **<u>බති සැරයන් භෝජනාගාරය</u>**. බලෙත් නිලධාරීන් සහ සැරයන්වරුන් 63 දෙනෙකුගෙන් සමන්විත පිරිසක් මෙහි ප්‍රයෝජන ගන්නා අතර ආහාර සහ නවාතැන් පහසුකම් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ඔවුන් හට සැපයේ.

ඊ. **<u>කෝප්‍රල් සමාජ ශාලාව</u>**. කෝප්‍රල් සමාජ ශාලාවේ පහසුකම් හා සෙසු කටයුතු අධීක්ෂණය නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

ඏ. **සෙසුනිල හෝජනාගාරය**. ආයතනය විසින් සෙසුනිල සමාජයේ කටයුතු ඉහළ දැමීම සහ පහසුකම් සැපයීමේ අරමුණින් පහත සඳහන් කාර්ය සිදු කර ඇත.

(1) පුටු මේස අලුත්වැඩියාව
(2) ගොඩනැගිලි පින්තාරු කිරීම
(3) දොර ජනේල් අලුත්වැඩියාව
(4) විදුලි පංකා අලුත්වැඩියාව
(5) මේස රෙදි ආහාර වර්ග හ තිරරෙදි අලුත්වැඩියාව

ඐ. **හට නිවාස අංශය**. මෙම අංශය මගින් විදුහලේ සියලු අලුත්වැඩියා කටයුතු හා නඩත්තු කටයුතු සිදු කිරීම වගකීම වන අතර පුහුණු ආධාරක අංශයට උපකාර කිරීමද සිදු වේ.

එ. **ඉංජිනේරු සේවා රෙජිමේන්තු අංශය**. විදුහලේ ඉංජිනේරු සේවා අංශයට පහත සඳහන් වගකීම් පැවරේ.

(1) ගොඩනැගිලි වෙනත් පහසුකම් හා පුහුණු උපකරණ නිර්මාණය කිරීම නඩත්තුව සහ අලුත්වැඩියා කිරීම.
(2) ජලය සහ විදුලිය සැපයුම.
(3). පහත සඳහන් ඉදිකිරීම ඉසේරෙ මගින් 2011 දී සිදු කර ඇත.

| අංකය | ඉදිකිරීම්/අළුත් වැඩියා කිරීම් | වියදම ශ්‍රීලංකා මුදලින් |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | ගුවන් හමුදා අංශය සඳහා අතිරේක කාර්‍යාල පරිශ්‍රයක් සඳහා | 115,000.00 |
| 2. | ලිපිද්‍රව්‍ය වෙළඳසැල ඉදි කිරීම | 455,000.00 |
| 3. | කැපටේරියා ගොඩනැගිල්ල ඉදි කිරීම | 1,300,000.00 |
| 4. | සෙසු නිලයින්ගේ වැසිකිළි හා ඒ අවට ඉදිකිරීම | 85,000.00 |
| 5. | නිවාස 10ක වහල අලුත්වැඩියාව | 75,000.00 |
| 6. | සිවිල් සේවක නිවාසය සහ ඉන්ධන ගබඩාව අලුත්වැඩියාව | 154,000.00 |
| 7. | බලලත් නිලධාරි සහ සැරයන් නිවස්නය අසල බැම්ම ඉදිකිරීම ග | 145,000.00 |
| 8. | වෛද්‍ය මධ්‍යස්ථානය පිළිසකර කිරීම | 105,000.00 |
| 9. | වාහන නැවතුම්පළ ඉදිකිරීම | 35,000.00 |
| 10. | කාන්තා බලකා නේවාසිගාරර 1 සහ 11 පිළිසකර කිරීම | 128,000.00 |
| 11. | මේජර් නේවාසිකාගාරය අලුත්වැඩියාව | 118,000.00 |
| 12. | උපදේශක නිලධාරි කාර්යාලය 1/7 පිළිසකර කිරීම | 57,000.00 |
| 13. | ආපන ශාලාව පිළිසකර කිරීම | 55,000.00 |
| 14. | නිලධාරි නිවස්නය පිළිසකර කිරීම | 180,000.00 |
| 15. | ටෙනිස් පිටිය පිළිසකර කිරීම | 48,000.00 |
| 16. | ශිෂ්‍ය නිලධාරි නිවස්නය පිළිසකර කිරීම | 1,478,000.00 |

**වගුව - 9**





ඒ. **<u>වෛද්‍ය මධ්‍යස්ථානය</u>**. ආසේඅමාවි වෛද්‍ය මධ්‍යස්ථානය දෛනික බාහිර රෝගී ප්‍රතිකාර සේවාවක් සිදු කරන අතර රෝගීන් සඳහා සුළු ප්‍රතිකාර කරනු ලැබේ. වැඩිදුර ප්‍රතිකාර අවශ්‍ය රෝගීන් හමුදා රෝහල් වෙත යොමු කරනු ලැබේ. ත්‍රිවිධ හමුදාව මගින් වෛද්‍ය නිලධාරීන් මාසිකව සේවාවේ යොදවයි. 2011 වර්ෂය තුළදී ප්‍රතිකාර ලබා ගත් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| (1) | නිලධාරී | - | 240 |
| (2) | ත්‍රිවිධ හමුදා සාමාජිකයින් | - | 1896 |
| (3) | සිවිල් සේවකයින් | - | 602 |
| (4) | විදේශීය ශිෂ්‍ය නිලධාරීන් | - | 34 |

ඔ. මීට අමතරව විද්‍යාලීය වෛද්‍ය අංශය මගින් පහත සඳහන් සේවාවන්ද ඉටුකර ඇත.

(1) වාර්ෂික සහ වාර අවසාන ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ සිදු කිරීම.

(2) වෛද්‍ය සහ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්.

(3) බෝවන රෝග සහ වසංගත රෝග නිවාරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(අ) ඩෙංගු.

(ආ) අරක්කැමින් හා භෝජනාගාර සේවකයින් පරීක්ෂාව.

(ඇ) ආසේඅමාවි මාසික වෛද්‍ය පරීක්ෂණ.

34. **<u>සුභ සාධන පහසුකම්</u>**. පහත සඳහන් සුභ සාධන පහසුකම් ආසේඅමාවි රාජකාරී කරන නිලධාරීන් සහ සෙසු නිලයන් සඳහා සපයා ඇත.

අ. දැනට විද්‍යාලයේ ඇති ක්‍රීඩාගාරය සහ ක්‍රීඩාපිටිය (දැනට ප්‍රමාණවත් නොවේ).





ආ. පහත සදහන් පහසුකම්ද විද්‍යාලයේ සේවය කරන නිලධාරි සෙසු නිලයින් සහ සිවිල් සේවකයන් සදහා සපයා ඇත.

(1) ආපන ශාලාව.





(2) ජන අවන්හල සහ සුහසාධක වෙළෙදසැල.



(3) නොම්ලේ විදුහලේ සිට කිරිබත්ගොඩ දක්වා යාමට හා ඒමට ප්‍රවාහන පහසුකම්.

35. <u>**ගණකාධිකාරි කාර්යාලය**</u>. ආරක්ෂක අමාත්‍යාංශය විසින් පත්කරන ලද ගණකාධිකාරිවරයෙකු විද්‍යාලය වෙත ලබා දි ඇත.

අ. ගණකාධිකාරි කාර්යාලය විසින් කරනු ලබන සේවාවන්:

(1) කාලිනව මුල්‍යමය ප්‍රකාශන පිළියෙල කිරිම සහ ඉදිරිපත් කිරිම.
(2) මුල්‍යමය තක්සේරු වාර්තා පිළියෙළ කිරිම.
(3) සියලුම ආදායම් සහ වියදම් රැස්කර නිසි පරිදි නිවැරදි සකස් කිරිම් සහ වර්ගීකරණය කිරිම.
(4) මාසික බැංකු සැසැදුම්පත් හා වාර්තා පිළියෙල කිරිම.
(5) මුල්‍යමය පාලන පිළිවෙලක් පිහිටුවා එය නඩත්තු කිරිම.
(6) රා.අ.අ මුදල් අමාත්‍යාංශය දේශිය ආදායම් දෙපාර්තුමේන්තුව වැනි රාජ්‍ය ආයතන සමග සහසම්බන්ධතාවයෙන් කටයුතු කිරිම.
(7) කාලිනව මුදල් ප්‍රතිපාදන ඉල්ලිම හා ගෙවිම් කටයුතු සිදු කිරිම.

ආ. ගණකාධිකාරි කාර්යාලය ගණකාධිකාරිවරයෙකු හා ලිපිකරුවන් තිදෙනෙකුගේන් සමන්විතයි.

ඇ. ආසේඅමාවි මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමෙන් අනතුරුව කළමණාකරණ මණ්ඩලයේ නිර්දේශයද ලබා රා.අ.අ විසින් අනුමත කර ඇති මූල්‍ය ප්‍රකාශනය ඇමුණුම 'අ' වශයෙන් වාර්ශික වාර්තාවේ ඇත.

ඇ. ගණකාධිකාරි කාර්යාලය මිලියන **95** ක් ගෙවා ඇති අතර මිලියන 174.2 ක පුනරාවර්තන සහ මූලධන වියදම් වශයෙන් **2011** වසරේ ගෙවා ඇත. මුදල් පොත් වැය වාර්තා සහ පාලන වාර්තා අනුව මෙම ගෙවීම් සිදු කර ඇත.

**36**. **<u>සිවිල් පරිපාලන කාර්යාලය</u>**. **2010** වර්ශයේදී සිවිල් සේවකයින් **88** දෙනකු සිටි අතර, ඇබැර්තු **10** ක් **2011** වර්පයේදී පුරවන ලදි.

අ. සිවිල් පරිපාලන කාර්යාලය මගින් පහත සඳහන් රාජකාරි ඉටු කරනු ලබයි.

(1) සිවිල් සේවකයින් සේවයෙහි යෙදවීම දෛනික පාලන කටයුතු, ලිපි ලේඛණ හා අනෙකුත් රාජකාරි පරිපාලන කටයුතු සිදු කරයි.
(2) ආසේඅමාවි සේවය කරන සිවිල් සේවකයින්ගේ සියලුම පාලන කටයුතු සිදුකිරීම
**(3)** සිවිල් සේවක වැටුප්, බඳවා ගැනීම් විශ්‍රාම ගැන්වීම හා අනුමැතිය ලබා ගැනීම හා අනෙකුත් පරිපාලනමය ආයතන සමග සම්බන්ධතාවය පවත්වගෙන යාම.

ආ. ආසේඅමාවි අවශ්‍යතා රාජකාරි ඉටුකිරීම.

ඇ. මෙම අංශයේ සිවිල් පරිපාලන නිලධාරියෙකු හා ලිපිකරුවන් දෙදෙනෙකුගෙන් සමන්විතයි.

**37.** **<u>අභ්‍යන්තර විගණන කාර්යාලය.</u>**

අ. ආසේඅමාවි විද්‍යාලය ස්වාධීන ආයතනයක් බවට පත් වූවාට පසු අභ්‍යන්තර විගණන කාර්යාලයක් මුදල අංශයට පරිබාහිරව පිහිටුවන ලදි. එසේ වූවද මෙම කාර්යාලය සේනාවිධායක තුමාට හා කළමණාකරන මණ්ඩලයට වගකීව යුතුවේ.

ආ. අභ්‍යන්තර විගණන කාර්යාලය ගණකාධිවරයකු සහ ගිණුම් ලිපිකරුවන් දෙදෙනෙකකුගෙන් සමන්විත වේ.

ඇ. අභ්‍යන්තර විගණන කාර්යාලයේ කාර්යභාරය පහත පරිදිය.

(1) වාර්ෂික විගණන වාර්ථා පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම.
(2) පවතින විගණන ක්‍රියාදාමය කාලීනව ඇගයීම සහ එහි ඇති දූර්වලතා හා ප්‍රථිපලදායි ක්‍රියාවන් හදුනා ගැනීම සහ ඒවාට පිළියම් යෝජනා කිරීම.
**(3)** විගතණ කළමනාකාර කම්ටුව කැදවා, මූල්‍යමය වාර්ථා, තොග වාර්ථා, සහ අවශ්‍ය ලිපි ලේඛණ පරික්ෂා කර බලා එහි කරුණු අභ්‍යන්තර විගගන වාර්ථාවට ඇතුල් කිරීම.
(4) ව්‍යවස්ථානුකූල නීති රීති චක්‍රලේඛන හා උපදෙස් මාලා නිසිපරිදි ක්‍රියාත්මක කරනවාදැයි පරික්ෂාකාරිව සිටීම.
**(5)** මහා භාන්ඩාගාරය පොදු ව්‍යාපාර පිළබඳ කාරක සභාව සදහා අවශ්‍ය නිර්දේශ හා නිගමන පිළියෙල කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සදහා අවශ්‍ය දත්ත තොරතුරු පිළියෙල කිරීම.

ඇ. **2011** වර්පයේදී විගණන හා කළමණාකරන කමිටු රැස්වීම් **3** ක් පවත්වා ඇති අතර, පැන නැගි තිබූ ගැටලු හඳුනාගෙන එමගින් විදුහලේ අභ්‍යන්තර විගණන පාලන ක්‍රමය ශක්තිමත් කිරීමට පියවර ගැනීම.

**38.** <u>**වර්ෂය තුල සිදු කරනු ලැබූ යටිතල පහසුකම් සංවර්ධනය**</u>. ඉහත "**33**" ඡේදයේ උප ඡේද " ඒ" හි සඳහන් කරන ලද සංවර්ධන කටයුතු කරනු විට පහත සඳහන් ඉදිකිරීම් ද සිදුකර ඇත.

| අංකය | විස්තරය | කොන්ත්‍රාත්කරු | වෙනත් |
|---|---|---|---|
| **(අ)** | **(ආ)** | **(ඇ)** | **(ඈ)** |
| 1. | ඇලුමිනියම් ෆැබ්රිකේෂන් | ඇලුකෙයා (පුද්ගලික සමාගම) රු. 809,838.40 | |
| 2. | ටෙනිස් පිටිය නවීකරනය | බිස්ටෙක් (පුද්ගලික සමාගම) රු. 947,500.00 | |
| 3. | අභ්‍යන්තර මාර්ග කාපට් කිරිම | කැන්ඩි කන්ස්ට්‍රක්ෂන් රු. 15,234,527.00 | |
| 4. | ක්ෂේත්‍ර වැසිකිලි 02 ක්හා වැසිකිලි 02 ඉදිකිරිම | AIM ඉන්ජිනියරින් රු. 607,000.00 | සම්පූර්ණයි |
| 5. | ලිපිද්‍රව්‍ය වෙළඳ සැල නවීකරනය | AIM ඉන්ජිනියරින් රු. 379,453.00 | |
| 6. | අවන් හල ඉදිරිපස සිමින්ති ගල් ඇතිරිම | නිශාන්එන්ටර් ප්‍රයිසස් රු. 28,399.65 | |
| 7. | ආපන ශාලාව ඉදිරිපස සිමින්ති ගල් ඇතිරිම | නිශාන් එන්ටර් ප්‍රයිසස් රු. 67,999.95 | |

**වගුව -10**

**39.** 2011 වර්ෂයේ වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදන මගින් පහත සඳහන් ඉදිකිරිම් ආරම්භ කරන ලද අතර ඉතිරි වැඩ කටයුතු නිම කල යුතුය.

| අ.අ | විස්තරය | වගකීම | විශේෂ |
|---|---|---|---|
| **(අ)** | **(ආ)** | **(ඇ)** | **(ඈ)** |
| 1. | මහල් හතරකින් යුත් සින්ඩිකේට් ගොඩනැගිල්ල | ශ්‍රී ලංකා නාවික හමුදාව | 2011 වර්ෂයේ හි 20 % සම්පූර්නය |
| 2. | ශිෂ්‍ය නිළධාරි විවාහක නිවාස (බ්ලොක් 03) ඉදිකිරිම | ශ්‍රී ලංකා ගුවන් යමුදාව | 2011 55%ක් නිමයි ඉතිරිය 2012 දි නිම කල යුතුවේ |
| 3. | ද්විත්ව මාර්ග ඉදිකිරිම් | ශ්‍රී ලංකා ගුවන් යමුදාව | 2011 දි 30%ක් නිම වී ඇත |

**වගුව -11**

**40.** <u>**විශේෂ ව්‍යාපෘති**</u>. රජයේ "අපි වෙනුවෙන් රට නගමු" ව්‍යාපෘතිය යටතේ විද්‍යාලයට අයත් කුඹුරු අක්කර 4ක් වගා කල අතර, ඒ වෙනුවෙන් රු:146,000.00 මුදලක් ආයෝජනය කල අතර අපේක්ෂිත ආදායම දළ වශයෙන් රු: 250000:00 කි.

<u>**නිර්දේශ**</u>

**41**. වර්ධනය වන ශිෂ්‍ය නිළධාරි සංඛ්‍යාව සහ කාර්ය මණ්ඩලය සඳහා නැවතිමේ පහසුකම් සැපයීමට දැනට විද්‍යාලයේ තිබෙන නවාතැන් පහසුකම් වැඩි දියුණු කල යුතු වේ.

**42.** පරිගණක විද්‍යාගාරය, පුස්තකාලය, ආදර්ශ පංති කාමර වැනි පුහුණු පහසුකම් වර්ධනය කල යුතු වේ.

**43**. මුද්‍රිත ලිපි මගින් කෙරෙන ලිපි ගනුදෙණු අවම කර අන්තර් ජාල සම්බන්ධතා මගින් රාජකාරි ඉක්මනින් සහ අඩු වියදමකින් සිදු කිරිම සඳහා අවශ්‍ය පහසුකම් ලබා ගැනිම.

**<u>සමාලෝචනය</u>**

**44**. ආසේඅමාවි කැපී පෙනෙන වර්ධනයක් සහ ප්‍රගතියක් ලබා ගනිමින් විද්‍යාලයේ අරමුණු හා ඉලක්ක කරා ළගා වීමට හැකියාව ලැබී ඇත.පාඨමාලා විෂය නිර්දේශය නැවත සමාලෝචනයට ලක්කිරීමෙන් අනතුරුව වර්තමාන යුධ හමුදා ඉලක්කයන් කරා පිය නැගීමට අවශය වෙනස්කම් බොහොමයක් විද්‍යාලීය කළමනාකරණ මණ්ඩලය තුළින් අනුමැතිය ඇතුව සිදුකර ඇත.

**45**. විද්‍යාලය විසින් 2011 වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් නිසි කළමනාකරනයකින් සිදුකර ඇති අතර, 2011 සංයුක්ත සැලැස්ම ප්‍රකාර ගොඩනැගිල්ල ඉදිකිරීම් ආරම්භ වි ඇත. **2015** වර්ෂයේ දි විද්‍යාලයේ නිමකිරීමට නියමිත ඉදිකිරීම් හා යටිතල පහසුකම් බොහෝමයක් ආරම්භ කර ඇත.

**46**. මුදල් ප්‍රතිපාදන වියදම් කිරීම හා මූල්‍යමය ප්‍රකාශනය රාආඅ විසින් අනුමත කර ඇති අතර, කළමනාකරණ මන්ඩලය විසින් ක්‍රියාවට නංවා ඇත.

**47**. ආසේඅමාවි කැපී පෙනෙන යටිතල පහසුකම් සංවර්ධනය වි ඇති අතර, පාඨමාලා හි ත්‍රිවිධ හමුදා නිලධාරින්ගේ අවශ්‍යතාවයන් අනුව දැනට පවතින ආසේඅමාවි සැලැස්ම නැවත සමාලෝචනය කිරීමට කලමණාකරණ මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී පියවර ගැනීම කාලෝචිතය.

# ගණකාධිකාරිගේ ප්‍රකාශය

1. 2011 වර්ෂය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයට තවත් ඉතා සාර්ථක වසරක් බවට පත්වීම සම්බන්ධයෙන් මාගේ සතුට ප්‍රකාශ කරන අතර විද්‍යාලයේ මෙහෙවර දැක්ම හා පරමාර්ථ වලට අනුකූලව මූල්‍ය තත්වය හා අධ්‍යන ක්‍රියාකාරකම් මනා සමතුලිතතාවයකින් පවත්වාගෙන යාමට හැකිවීම ඊට හේතු විය. ගිණුම්කරණ අංශය ලෙස අපගේ පරමාර්ථය වනුයේ,

අ. මූල්‍ය ප්‍රකාශන නිසි වේලාවට පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම.

ආ. අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම.

ඇ. සියලුම ආදායම් හා වියදම් නිවැරදි වර්ගීකරණය හා වාර්තා කිරීම.

ඈ. මාසික බැංකු සැසඳුම් පිළියෙළ කිරීම.

ඉ. ගිණුම්කරණ පාලන පද්ධතීන් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම.

ඊ. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයල මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

උ. නිසි කළමණාකාරිත්වයෙන් යුතුව මුදල් ඉල්ලුම් කිරීම හා බිල්පත් පියවීම.

2. පුනරාවර්තන හා මූලධන ගෙවීම් සම්බන්ධව වාර්තා පවත්වා ගැනීම, කාලීන හා වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, වඩා අර්ථවත් තීරණ ගතහැකි වන පරිදි කළමණාකරණය සඳහා මූල්‍ය තොරතුරු සපයීම, මුදල් ප්‍රවාහ කළමණාකරණය හා මුදල් කටයුතු වාර්තා පවත්වාගෙන යාම මගින් විද්‍යාලයේ මූල්‍යමය හා ගිණුම්මය කටයුතු සැබැඳිව අපගේ වගකීම් නිසි පරිදි ඉටු කිරීමට හැකි විය.

3. රු. 2,011,213 ඌනතාවයක් වර්ෂය තුල සටහන් වුවද, පසුගිය වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂය තුළදී විද්‍යාලයේ මූල්‍ය තත්වය වර්ධනය විය.

4. 2010 වර්ෂයට සාපේක්ෂව සමාලෝචන වර්ෂය තුළදී විද්‍යාලයේ වත්කම් පදනම රු.මිලියන 480 සිට රු.මිලියන 634 දක්වා 32% කින් වර්ධනය වූ අතර යටිතල පහසුකම් සංවර්ධනය හා ස්ථාවර වත්කම් අත්පත්කරගැනීම වෙනුවෙන් වූ ආයෝජන මූල්‍ය තත්වය සැලකිය යුතු ලෙස වර්ධනයට හේතු විය. විද්‍යාලය සඳහා අනුමත වූ රු. මිලියන 175 ක මූලධන ප්‍රතිපාදන ප්‍රමාණයෙන් රු.මිලියන 154 ක්ම යටිතල පහසුකම් සංවර්ධනයට යෙදවිය. ඒ අතරල මහල් 4 කින් යුත් සින්ඩිකේට් ගොඩනැගිල්ල ඉදිකිරීමල ද්විත්ව මාර්ගය ඉදිකිරීම ශිෂ්‍ය නිලධාරින්ගේ විවාහක නිවාස ඉදිකිරීම හා විද්‍යාලයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය කාපට් කිරීම විශේෂිත විය. තවද, වර්ෂය තුළදී ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ප්‍රදානය කරන ලද මෝටර් රථ 2 ද විද්‍යාලයේ වත්කම් පදනම වර්ධනයට හේතු විය.


5. 2010 වර්ෂයේ විද්‍යාලයේ මුළු වියදම රු.මිලියන 93.96 ක් වූ අතර, එය 2011 වර්ෂයේ රු.මිලියන 98.84 දක්වා වැඩිවීමට වර්ෂය තුලදී පුද්ගල සංවේතන වල හා ශිෂ්‍ය නිලධාරින්ගේ හා විද්‍යාලීය කාර්ය මණ්ඩලය වැඩිවීමට සාපේක්ෂව ගිවිසුම්ගත සේවාවන්ගේ වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපාන ලදි.

6. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කරන ලදි. ගිණුම්කරණ අංශය වශයෙන්, 2011 වර්ෂයේ නිවැරදි දේ අඛණ්ඩව පවත්වා ගෙන යන අතරම ඉදිරි වර්ෂයන් වලදී විද්‍යාලයේ මූල්‍යමය හා ගිණුම් කරණ කටයුතු වඩා විධිමත්ව හා කාලීන වෙනස්වීම් වලට අනුරූපව ඉටුකිරීමට සූදානම් බවද සඳහන් කරමි.

**<u>ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ කාර්ය සාධනය</u>**

**<u>උපාධිධාරීන්ගේ ප්‍රමාණය</u>**


2007ට සාපේක්ෂව 2011 වර්ෂයේ උපාධිධාරී ප්‍රමාණය 73 කින් වර්ධනය වී ඇත.




**<u>දේපල පිරියත සහ උපකරණ වර්ධනය</u>**


ගොඩනැගිලි සහ පිරියතල උපකරණ සහ වාහනවල වර්ධනයක් පෙන්නුම් කරයි

රු.මිලියන




L & B - ඉඩම් සහ ගොඩනැගිලි
P & M - පිරියතල උපකරණ සහ රථ වාහන
F & E - ගෘහ භාණ්ඩ සහ උපකරණ


## වියදම් විස්තරය




| | රු.මිලියන |
|---|---|
| PE – පුද්ගල සංවේතන | 25.74 |
| CS - ගිවිසුම්ගත සේවා | 29.26 |
| සැපයුම්කරුවන් | 25.57 |
| නඩත්තු වියදම් | 18.28 |


### *අයවැය වෙන්කිරීම් පුනරාවර්තන වියදම්*

රු.මිලියන





### *අයවැය වෙන්කිරීම් - මූලධන වියදම්*

රු.මිලියන




## විදේශ ශිෂ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වය




එච් එම් එන් දර්ශන
ඒසීඒලඒසීඑම්ඒලබීඑස්සී කළමණාකරණ (විශේෂ)
ගණකාධිකාරි

**ඇමුණුම ආ**

**වාර්ෂික වාර්ථාව - 2011**

## අභ්‍යන්තර විගණන නිළධාරී වාර්තාව

1. ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පාර්ලිමේන්තු පනතක් මගින් ස්වාධීන ස්ථාපිත ආයතනයක් බවට පත්විමෙන් පසු අභ්‍යයන්තර විගණන හා විමර්ශන අංශය 2010 සැප්තැම්බර් 01 වන දින පිහිටුවන ලදි. මෙම අංශයේ අමාත්‍යංශයේ මුදල් අංශයේ අනු අංශයක් ලෙස පිහිටුවන ලද අතර එය ඉදුරාම ආසේඅමාවි සේනාවිධායක වෙතින් කළමණාකරන මණ්ඩලයට වගකිව යුතු වේ.

2. මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරය වනුයේ වාර්ෂික විගණන වාර්ථාව සකස් කිරීම හා එය ක්‍රියාවට නැංවීමත්ල පවත්නා මූල්‍යමය පාලන ක්‍රමය ඇගයීමකට ලක්කර එහි ඇති දුර්වලතා හා හරවත ක්‍රියා දාමයන් හඳුනාගෙන අවශ්‍ය පියවර ගැනීමක් සඳහා යෝජනා කිරීම වේ. එමෙන්ම මුදල් කළමණා කරණ කමිටුව කැඳවා මූල්‍යමය ප්‍රකාශන වැනි කාලින ප්‍රකාශන එළිදැක්විමටත් තොග වාර්ථා අභ්‍යන්තර විගණන වාර්තා හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා පනත් හා චක්‍රලේඛන අනුව ක්‍රියා කරන බවට සහතික කිරීමක් වේ.

3. 2011 දෙසැම්බර් 31 වන දිනට අවසන්වන මුදල් වර්ෂය තුලදි මෙම ආයතනයේ පහත සඳහන් කරුණු නිරීක්ෂණය වූ අතර එම කරුණු යතාවත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනිමට මෙම අංශය පියවර ගන්නා ලදි.

අ. වැටුප් ලෙජරයට හර කරන ලද මුලු වැටුප් මුදල් සඳහා මාසික පැසඳුම් පත් සැකසීම.

ආ. රාජ්‍ය ව්‍යාපාර කළමණාකරන දෙපාර්තමේන්තුවේ චක්‍රලේක අංක ජැ෴47 අනුව ආසේඅමාවි සඳහා සංයුක්ත සැලැස්මක් පිලියෙල කිරීම.

ඇ. පරිගණක සහ උපාංග සඳහා වත්කම් ලේඛණයක් පිලියෙල කිරීම

ඈ. නිසිකලට විදුලි බිල්පත් නිරවුල් කිරීමෙන් අවශ්‍ය දඩ මුදල් අඩුකර ගැනීම.

ඉ. රාජ්‍ය සේවක පඩි ලැයිස්තු ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් හෝ වෙනත් විශ්වාසනිය පඩි ලැයිස්තු ක්‍රමයක් අනුගමනය කිරීම මගින් දැනට ක්‍රියාත්මක පවතින විද්‍යාලය විසින් පිලියෙල කරන ලද ලැයිස්තු ක්‍රමය අහෝසි කිරීමට පියවර ගැනීම.

ඊ. ප්‍රාග්ධන වත්කම් ලබාගැනීමට ප්‍රථම හා සංවර්ධනය කිරීමට පෙර රාජ්‍ය සැලසුම් දෙපාර්ථමේන්තුව අනුමැතිය ලබාගැනීම.

එ. වාර්ශික භාන්ඩ සමික්ෂනයේදි අහෝසි කිරීමේ මණ්ඩලවල කාර්යයන් කඩිනම් කිරීම.

ඒ. උපකරණ ගබඩාඩ, පුහුණු ආධාරක අංශය හා ප්‍රවාහන අංශය තුල අන්තර් සම්බන්ධතාවය පවත්වා ගනිමින් ප්‍රසම්පාදන සැලැසුමක් සැකසීම හා පවත්වාගෙන යාම.

උ. කළමණාකරන මණ්ඩලය විසින් ගනු ලබන තිරන ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරන කමිටුවක් පත්කිරීමේ අවශ්‍යතාවය.

4. මේ අතර ඉහත සඳහන් සමහර කරුනු විගණන හා කලමණාකරන කමිටුව සැලකිල්ලට ගන්නා ලද අතර එම කරුණු ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය පියවර කමිටුවේ උපදෙස් පරිදි සිදුකර ඇති බව සතුටින් සඳහන් කරමි.

එම් එස් කලුආරච්චි
අභ්‍යන්තර විගණන නිළධාරි

ඇමුණුම ඇ.
වාර්ෂික වාර්තාව 2011

## ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - සපුගස්කන්ද
## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| 2011.12.31 දිනට | සටහන් | 2011 Rs | 2010 Rs |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 02 | 634,092,346 | 480,330,931 |
| මුළු ජංගම නොවන වත්කම් | | 634,092,346 | 480,330,931 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 03 | 2,306,407 | - |
| අත්තිකාරම් සහ පෙර ගෙවීම් | 04 | 194,339 | 14,050 |
| මුදල් හා මුදල් සමාන දෑ | | 10,267 | 302,238 |
| මුළු ජංගම වත්කම් | | 2,511,013 | 316,288 |
| **මුළු වත්කම්** | | **636,603,359** | **480,647,219** |
| **ස්කන්ධය සහ බැරකම්** | | | |
| සමුච්චිත අරමුදල | 05 | 614,896,125 | 451,910,711 |
| තැන්පතු ගිණුම | 06 | 1,347,246 | - |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 07 | 2,737,332 | 174,261 |
| ණය හිමියන් | 08 | 17,622,656 | 28,562,247 |
| මුළු වගකීම් | | 20,359,988 | 28,736,508 |
| **මුළු සමුච්චිත අරමුදල සහ වගකීම්** | | **636,603,359** | **480,647,219** |

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ඉහතින් දක්වා ඇති මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය සහ ඉදිරිපත් කර ඇති මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ ගිණුම්කරණ පොත්.වාර්තා සහ අනෙකුත් සියලුම ගිණුම්කරණ තොරතුරු වලට අනුකූලව පිළියෙල කර ඇත.

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.

අත්සන් කලේ ??????
එස් හෙට්ටිආරච්චි
අතිරේක ලේකම්
ආරක්ෂක හා නාගරික සංවර්ධන
අමාත්‍යාංශය
සාමාජික. කළමණාකරණ මණ්ඩලය
ආසේඅමාවි

අත්සන් කලේ ??????
ජේ සී රණුක්පොත ආර්එස්පි යූඑස්පි
මේජර් ජෙනරාල්
සේනාවිධායක
ආසේඅමාවි

අත්සන් කලේ ???
එච්එම්එන් දර්ශන
ගණකාධිකාරි
ආසේඅමාවි

අත්සන් කලේ ???
ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පි ආර්එස්පි
ලේකම්. ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය
සභාපති. කළමණාකරණ මණ්ඩලය
ආසේඅමාවි

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - සපුගස්කන්ද
2011 වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

| 2011.12.31 දිනට ශේෂපත්‍රය | සටහන් | 2011 රු. | 2010 රු. |
|---|---|---|---|
| රජයේ ප්‍රදාන | | 95,000,000 | 69,118,368 |
| වෙනත් ප්‍රදාන | 09 | 2,437,871 | - |
| **මුළු ආදායම** | | **97,437,871** | **69,118,368** |
| **වියදම** | | | |
| පුද්ගල සංවේතන | | 25,738,628 | 23,348,499 |
| පාරිතෝෂික හා සැපයුම් | | 25,572,568 | 36,282,250 |
| තඩත්තු වියදම් | | 18,277,943 | 7,840,575 |
| ගිවිසුම්ගත සේවාවන් | | 29,256,172 | 26,494,849 |
| **මුළු වියදම** | 10 | **98,845,311** | **93,966,173** |
| ක්ෂයවීම් ගැලපීමට පෙර මෙහෙයුම් අතිරික්තය/ (ඌනතාවය) | | (1,407,440) | (24,847,804) |
| ක්ෂයවීම් | 11 | 609,774 | 202,580 |
| **වර්ෂයේ ශුද්ධ ඌනතාවය** | | (2,017,213) | (25,050,384) |

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් ප්‍රකාශනයන් හි කොටසක් වේ.

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - සපුගස්කන්ද
2011.12.31 න් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | සමුච්චිත අරමුදල<br>රු. | තැන්පතු ගිණුම<br>රු. |
|---|---|---|
| **2010.01.01 දිනට ශේෂය** | 453,950,877 | - |
| වැඩිවීම් (අඩුවීම්) | | - |
| ඌනතාවය (වර්ෂය සඳහා ශුද්ධ අලාභය) | (25,050,384) | |
| ගැලපුම් | 23,010,218 | |
| **2010.01.01 දිනට ශේෂය** | **451,910,711** | - |
| වැඩිවීම් (අඩුවීම්) | 165,002,627 | 1,347,246 |
| ඌනතාවය | (2,017,213) | |
| **2011.12.31 දිනට ශේෂය** | **614,896,125** | **1,347,246** |

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි කොටසක් වේ.

ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය - සපුගස්කන්ද
2011 වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| ලැබීම් | 97,439,428 | 67,600,000 |
| රජයේ ප්‍රධාන (පුනරාවර්තන) | 95,001,557 | 67,600,000 |
| වෙනත් ප්‍රධාන - (පුනරාවර්තන) | 2,437,871 | |
| වියදම් | 97,726,327 | 67,307,998 |
| පුද්ගල සවේතන | 25,423,989 | 23,219,279 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | 28,500,501 | 9,739,248 |
| නඩත්තු සහ ගිවිසුම්ගත සේවාවන් සඳහා වියදම් | 43,506,246 | 34,349,471 |
| වෙනත් වියදම් | 295,592 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (286,899) | 292,002 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම් | (14,115,592) | (25,165,891) |
| සංවර්ධන වියදම් | (159,200,298) | (21,146,360) |
| තැන්පතු ගිණුමට මාරුකිරීම් | (1,051,654) | - |
| ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (174,367,544) | (46,312,252) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය** | | |
| රජයේ ප්‍රධාන - (මූලධන) | 174,198,401 | 46,322,489 |
| වෙනත් ප්‍රධාන - (මූලධන) | 164,071 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 174,362,472 | 46,322,489 |
| **මුදල් හා මුදල් වලට සමාන දෑ හි සිදු වූ ශුද්ධ වෙනස** | **(291,971)** | **302,238** |
| 2011.01.01 දින මුදල් හා මුදල් සමාන දෑ | 302,238 | - |
| **2011.12.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ** | **10,266** | **302,238** |

මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්හි
කොටසක් වේ.

1. **ගිණුම්කරණ ප්‍රතිපත්ති.**

අ. **වාර්තාකරනු ලබන ආයතනය**.

(1) ආරකපක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය, 2008 පෙබරවාරි 19 වන දින සම්මත කරන ලද 2008 අංක 05 දරණ පාර්ලිමේන්තු පනත මගින් 2007 ජුනි මස 22 දින ස්ථාපිත කරන ලදි. මෙය එවකට පැවති යුද හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ අනුප්‍රාප්තිකයායි. යුද හමුදා අණ සහ මාණ්ඩලික විද්‍යාලය 1998 මාර්තු මස 16 වන දින ස්ථාපිත කරන ලද ආයතනයක් වේ.

(2) විද්‍යාලය සපුගස්කන්ද මාකොල ප්‍රදේශයේ පිහිටා ඇත.

(3) ආරක්පක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය ස්වාධින ආයතනයක් ලෙස පිළිගෙන මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරිමෙන් අනතුරුව ප්‍රථම වරට 2010 දි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදි.

ආ. **මූලික කාර්‍යයන්**. විද්‍යාලයේ මූලික කාර්‍යයන් පහත සඳහන් පරිදි වේ.

(1) විද්‍යාලයේ අධ්‍යන පාඨමාලා හැදෑරිම සඳහා ත්‍රිවිධ හමුදා නිලධාරින්, පොලිස් නිලධාරින්, රාජ්‍ය අයතනවල නිලධාරින් හා විදේශ හමුදා නිලධාරින් ඇතුලත් කර ගැනිම.
(2) ශිෂ්‍ය නිලධාරින් ඇගයිම සඳහා විභාග පැවැත්වීම.
(3) අධ්‍යන පාඨමාලා සාර්ථකව හැදෑරූ ශිෂ්‍ය නිලධාරින් වෙත සහතිකපත් නිකුත් කිරිම සහ පිඑස්සි (psc) නිළනාමය ප්‍රධානය කිරිම.

ඇ. **පිළියෙල කිරිමේ පදනම**.

(1) **අනුකූලතා ප්‍රකාශය.** මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්‍යසාධනය පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධගේ වෙනස්වීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනයන්ට සටහන් වලින් විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ අංක (SLAS) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPASAS) වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන ලදි.

(2) **මිනුම් දඬු සඳහා පදනම.** මූල්‍ය ප්‍රකාශ හා විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම යන පදනම මත පිළියෙළ කර ඇති අතර,ගිණුම්කරණ ප්‍රතිපත්ති මුළු කාල පරිච්ඡේදය පුරාවටම ඒකාකාරිව උපයෝගී කර ගෙන ඇත. මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමනකාරි බලපෑම් සඳහා ගැළපුම් කර නොමැත.

(3) **භාවිතා කරන සහ ඉදිරිපත් කිරිමේ මුදල් ඒකකය.** මෙම මූල්‍ය ප්‍රකාශන විද්‍යාලයේ භාවිතා වන මුදල් ඒකකය වන ශ්‍රිලංකා රුපියල් වලින් පිළියෙල කර ඇත.

ඇ. **<u>වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති.</u>**

(1) **<u>දේපල, පිරියත හා උපකරණ.</u>**

(අ) **<u>හඳුනා ගැනීම හා මිනුම් දඬු.</u>**

i. දේපල, පිරියත හා උපකරණ මුල් පිරිවැය හෝ ප්‍රත්‍යාගනක්පන අගයෙන් ක්ෂයවීම් අඩුකර දක්වා ඇත. 2010 වර්ෂය ප්‍රථම මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම සඳහා දේපල පිරියත හා උපකරණ 2009.12.31 දිනට ප්‍රත්‍යාගනනය කරන ලදී. වටිනාකමේ තක්සේරුව සුදුසුකම්ලත් පුද්ගලයින් විසින් එළදායි ක්ෂයවීම් අනුපාත හා වෙළඳ වටිනාකම සැලකිල්ලට ගෙන සිදුකර ඇත.

ii. විද්‍යාලයට පැහැදිලි හිමිකමක් නැති දේපල පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණනය කර නොමැති අතර, ගිණුම් වලටද ගෙන නැත. කෙසේවෙතත්, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් ලබාදී ඇත. වාහනවල අයිතිය එම ආයතනයන්ට අයත් වුවත්, එහි ප්‍රතිලාභ හා වියදම් විද්‍යාලය සතු බැවින් දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇත. එම වාහනවල අයිතිය විද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවා ඇති අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනයන්හි දේපල, පිරියත හා උපකරණ වශයෙන් දක්වා ඇත.

iii. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැයට එය අත්පත් කරගැනීමට හෝ ඉදිකිරීමට අදාල පිරිවැය සහ එම වත්කම් භාවිතා කළහැකි මට්ටමට ගෙන ඒම සඳහා දරණ ලද සියළු වියදම් ඇතුළත්ව ඇත.

(ආ) **<u>ක්ෂයවීම්</u>**.

i. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැය මත පහත සඳහන් ක්ෂය අනුපාතයන් යටතේ කපය වෙන්කිරීම් කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| යන්ත්‍රෝපකරණ | 12.5% |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 20% |
| වාහන | 20% |

ii. මූල්‍ය කාර්‍යසාධන ප්‍රකාශයේ ක්ෂයවීම් දේපල පිරියත හා උපකරණ වල ඇස්තමේන්තු ගත ආයුකාලය අනුව සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂයවීම් හඳුනාගෙන ඇත. ඉඩම් සහ කෙරීගෙන යන වැඩ සඳහා ක්ෂය වීම් ගණනය කර නොමැත. වර්ෂය තුල මිලදීගත් / ඉදිකරන ලද සියළු දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂයවීම් වෙන්කර ඇත.

iii. කෙරීගෙන යන වැඩ යන්නට වර්ෂය තුල ඉදිකිරීම් සම්පූර්ණ නොකරන ලද ගොඩනැගිලි අයත් වේ. එවැනි ව්‍යාපෘති සඳහා වන පිරිවැය කෙරීගෙන යන වැඩ
යටතේ ගිණුම්ගත කර ඇත.

(2) **රජයේ ප්‍රධාන සඳහා ගිණුම් තැබීම.**

අ. පුනරාවර්ථන ප්‍රධාන මූල්‍ය කාර්‍යසාධන ප්‍රකාශයේ ආදායම් වශයෙන් සලකා ඇත.

ආ. මූලධන වත්කම් අත්පත් කර ගැනීම් හා වැඩිදියුණු කිරිම වෙනුවෙන් ලබාදෙන ලද මූලධාන ප්‍රාධාන සමුච්චිත අරමුදලට ආදායම් වශයෙන් සලකා ඇති අතර, වත්කමවල ජීව කාලය තුලද ්එම ප්‍රධානයන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයන්ට හඳුනාගනු ලැබේ.

(3) **මුදල් ප්‍රවාහ ප්‍රකාශය.** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව ඍජු ක්‍රමය භාවිත කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.

(4) **වගකීම් හා වෙන්කිරීම්.** මූල්‍ය ප්‍රකාශය පිළියෙළ කිරීමේදී සියළු හඳුනාගත් වගකීම් ගිණුම්ගත කර ඇත.

(5) **ආදායම් හඳුනාගැනීම.** විද්‍යාලයේ ආදායම් යන්නට පුනරාවත්තන ස්වභාවයේ රජයේ ප්‍රධාන හා අනෙකුත් ප්‍රධාන ඇතුලත් වේ. සියළු ආදායම් හා වියදම් උපචිත පදනම අනුව හඳුනා ගෙන ඇත.

(6) **සේවක ප්‍රතිලාභ.** නිශ්චිත ලද දායකත්ව සැලසුම නිශ්චිත දායකත්ව සැලසුම සඳහා ඇති බැදිම මූල්‍ය කාර්‍යසාධන ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගෙන ඇත. සිවිල් සේවකයින් ගේ වේතනයෙන් 12% ක් දායකත්වයක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට විද්‍යාලය විසින් සපයනු ලැබේ.

(7) **අනෙකුත් මෙහෙයුම් නොවන වියදම්.** මූල්‍ය කාර්‍යසාධක ප්‍රකාශයේ අතිරික්තය/ ඌනතාවය ගණනය කිරීමේදී විද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වූ සියළු වියදම් මෙන්ම මූලධන වත්කම් නඩත්තු සඳහා වූ වියදම්ද සලකා ඇත.

(8) **සංසන්දනාත්මක තොරතුරු.** සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත්කිරීම් හා සැසඳීම් කළහැකි වන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යාවන් අවශ්‍ය පරිදි ඉදිරිපත් කර ඇත.

(9) **මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දිනට පසු.** මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනට පසුව සිදුවූ ප්‍රමාණාත්මක සිදුවීම් සඳහා අවශ්‍ය පරිදි ගැළපීම් තිසි මූල්‍ය ප්‍රකාශනයන්හි සිදුකර ඇත.

සටහන 02 : දේපළ ,පිරියත සහ උපකරණ

රු:

| විස්තරය | වියදම/වටිනාකම | | | |
|---|---|---|---|---|
| | 2011.01.01 දිනට ශේෂය | වර්ෂය තුළ නවාංග සහ සංවර්ධනය | වර්ෂය තුළ හමාර කිරීම් | 2011.12.31 දිනට වටිනාකම |
| ඉඩම් | 104,500,000 | - | | 104,500,000 |
| ගොඩනැගිලි | 312,513,872 | 108,295,582 | - | 420,809,454 |
| යන්ත්‍ර | 9,115,081 | 5,340,972 | - | 14,456,053 |
| වාහන | 33,521,500 | 7,400,000 | - | 40,921,500 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 44,352,128 | 10,572,931 | - | 54,925,059 |
| කෙරෙමින් පවතින වැඩ | - | 51,418,998 | - | 51,418,998 |
| | 504,002,581 | 183,028,483 | - | 687,031,064 |

| විස්තරය | ක්ෂය | | | |
|---|---|---|---|---|
| | 2011.01.01 දිනට ශේෂය | වර්ෂය සඳහා ක්ෂය | වර්ෂය තුළ හමාර කිරීම් | 2011.12.31 දිනට වටිනාකම |
| ඉඩම් | - | - | | - |
| ගොඩනැගිලි | 6,231,057 | 8,416,189 | - | 14,647,245.94 |
| යන්ත්‍ර | 1,139,385 | 1,807,007 | - | 2,946,391.81 |
| වාහන | 6,704,300 | 8,184,300 | - | 14,888,600.00 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 9,471,468 | 10,985,012 | - | 20,456,479.94 |
| කෙරෙමින් පවතින වැඩ | - | - | - | - |
| | 23,546,210 | 29,392,508 | - | 52,938,717.69 |

| | |
|---|---|
| ලියා හල අගය - 2011.12.31 | **634,092,346** |
| ලියා හල අගය - 2010.12.31 | 480,330,931 |

කෙරෙමින් පවතින වැඩ යටතේ ඇතුලත් ව්‍යාපෘති :

| | රු: |
|---|---|
| පංතිකාමර ගොඩනැගිලි | 41,993,407 |
| ද්විත්ව මාර්ග | 9,425,590 |
| | **51,418,998** |

**සටහන 03 : තොගය**

| | රු: |
|---|---|
| ආසේඅමාව් තොග | 984,200 |
| ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් ලැබීම් | 1,322,207 |
| | **2,306,407** |

**සටහන 04 : පෙර ගෙවීම්**

| | රු: |
|---|---|
| වාහන රක්ෂණ | 55,737 |
| වාහන රක්ෂණ | 138,603 |
| | **194,339** |

**සටහන 05 : සමුච්චිත අරමුදල**

| | රු: |
|---|---|
| 2011.01.01 දිනට ශේෂය | 451,910,711 |
| ගැලපීම් 1 | 19,026,897 |
| ආදායම් (රාජ්‍ය මූලප්‍රධනය) | 144,364,012 |
| ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් ලැබූ ලිපි ද්‍රව්‍ය තොගය | 1,322,207 |
| ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් ලැබූ ස්ථාවර වත්කම් තොගය | 164,071 |
| ගැලපීම් 2 | 125,440 |
| 2011 වර්ෂයේ හිගය | (2,017,213) |
| 2011.12.31 දිනට ශේෂය | **614,896,125** |

1. තැන්පත් ගිණුම මගින් කල ගෙවීම් හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ලබා දී ඇති වාහන වල වටිනාකම් විද්‍යාලයීය සමුච්චිත අරමුදලට ගලපා ඇත.

2. 2010 වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් හා ඒ සඳහා වූ ක්ෂය වීම් ගැලපීම.

**සටහන 06 : තැන්පත් ගිණුම**

| | රු: |
|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා මාරු කිරීම් | 295,592 |
| මූලධන වියදම් සඳහා මාරු කිරීම් | 1,051,654 |
| | **1,347,246** |

**සටහන 07 : උපචිත වියදම්**

| | රු: |
|---|---|
| සන්නිවේදන | 153,404 |
| විදුලිය | 1,952,209 |
| ජලය | 543,720 |
| වාහන කුලී හා බදු මුදල් | 88,000 |
| | **2,737,332** |

| සටහන 08 :ණය හිමියන් | රු: |
|---|---|
| පුද්ගල සංවේතන | 9,524 |
| සැපයුම් හා පරිභෝජන | 12,063,468 |
| නඩත්තු වියදම් | 5,323,013 |
| ගිවිසුම්ගත සේවා | 226,652 |
| | **17,622,656** |

| සටහන 09 : වෙනත් ප්‍රදාන | රු: |
|---|---|
| ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් ලද ලිපි ද්‍රව්‍ය | 1,920,970 |
| ශ්‍රී ලංකා යුධ හමුදාව වෙතින් ලද වෙනත් ද්‍රව්‍ය | 516,901 |
| | **2,437,871** |

| සටහන 10 : වියදම් | රු: |
|---|---|
| **පුද්ගල සංවේතන** | **25,738,628** |
| **සැපයුම් හා පරිභෝජන** | **25,572,568** |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලයිය අවශ්‍යතා | 4,980,688 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 14,735,636 |
| සංග්‍රහ වියදම් | 1,762,353 |
| පුවත්පත් | 106,730 |
| නවාතැන් පහසුකම් හා සිවිල් නිල ඇඳුම් | 2,002,289 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 1,984,873 |
| **නඩත්තු වියදම්** | **18,277,943** |
| | - |
| **ගිවිසුම්ගත සේවා** | **29,256,172** |
| සන්නිවේදනය | 1,597,504 |
| විදුලිය | 16,200,519 |
| ජලය | 8,472,393 |
| කුලි හා බදු මුදල් | 1,979,920 |
| සනීපාරක්ෂක | 91,573 |
| දේශන සහ වෙනත් | 914,262 |
| | **98,845,311** |

| සටහන 11 : ක්ෂය වීම් | රු: |
|---|---|
| 2011 වර්ෂය සඳහා ක්ෂය | 29,392,508 |
| මූල්‍ය කාර්ය සාධනය පිලිබඳ ප්‍රකාශයට මාරු කල විලම්භිත ආදායම් | 28,782,734 |
| ශුද්ධ ක්ෂය | **609,774** |

ඇමුණුම 'ඇ'
වාර්ෂික වාර්තාව - 2011


විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


මගේ අංකය / எனது இல / My No: ඩීආර්/බී/ඩීඑස්සීඑස්සී/එල්එච්/ 2012/03

ඔබේ අංකය / உமது இல / No.:

දිනය / திகதி / Date: 2013 ජනවාරි 18 දින

සභාපති,

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය.

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 05 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විද්‍යාලයේ සභාපති වෙත 2012 ජුලි 30 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail: oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම.

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන් , වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මාණ්ඩලික විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැ.19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) අංක 01/2004 සහ 2004 පෙබ. 24 දිනැති චක්‍රලේඛය | වාර්ෂික කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් වලින් ජනනය වූ මූල්‍ය ප්‍රතිඵලය රු.2,017,213 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.25,050,384 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.23,033,171 ක වර්ධනයක් දක්නට ලැබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලය රු.23,033,171 කින් වර්ධනය වීම සඳහා පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පහත සඳහන් ආදායම් සහ වියදම් වල වැඩිවීම සහ අඩුවීම හේතුවී තිබුණි.

(අ) රජයේ ආධාර රු.25,881,632 කින් හෙවත් 37.45% කින් වැඩිවීම
(ආ) වෙනත් ආධාර රු.2,437,871 කින් හෙවත් අනන්තයකින් % වැඩිවීම
(ඇ) සේවක දීමනා රු.2,390,129 කින් හෙවත් 10.27 % කින් වැඩිවීම
(ඈ) සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය වියදම රු.10,709,682 කින් හෙවත් 29.52% කින් අඩුවීම
(ඉ) නඩත්තු වියදම රු.10,437,368 කින් හෙවත් 133.12 % කින් වැඩිවීම
(ඊ) ගිවිසුම්ගත සේවා වියදම රු.2,761,323 කින් හෙවත් 10.42 % කින් වැඩිවීම
(උ) ක්ෂය ප්‍රතිපාදන රු.407,194 කින් හෙවත් 201% කින් වැඩිවීම

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

මාණ්ඩලික විද්‍යාලය මෙහෙයවනු ලබන උපාධි පාඨමාලාවට සමාලෝචිත වර්ෂයේ සහභාගි වූ සිසුන් සංඛ්‍යාව 83 ක් වූ අතර ඊට සාපේක්ෂව 2010 වර්ෂයේ සහභාගි වූ සිසුන් සංඛ්‍යාව 74 ක් විය. විස්තර පහත දැක්වේ.

| උපාධිධාරීන් සහභාගිවූ ආයතනය | උපාධිධාරීන් සංඛ්‍යාව 2011 | 2010 | වැඩිවීම/ (අඩුවීම) |
|---|---|---|---|
| යුධ හමුදාව | 48 | 46 | 02 |
| නාවික හමුදාව | 13 | 11 | 02 |
| ගුවන් හමුදාව | 14 | 11 | 03 |
| ආරක්ෂක අමාත්‍යාංශය | - | 01 | (01) |
| විදේශීය | 08 | 05 | 03 |
| | 83 | 74 | 09 |

උක්ත කරුණු අනුව පහත සඳහන් දෑ විගණනයට නිරීක්ෂණය විය.

(අ) මාණ්ඩලික විද්‍යාලය මෙහෙයවනු ලබන උපාධි පාඨමාලාවට සහභාගී වන සිසුන් සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ දී 09 කින් ඉහල ගොස් තිබුණි.

(ආ) ආදායම් සහ වියදම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂයේ මුළු වියදම රු.99,455,085 ක් වූ අතර ඒ අනුව එක් උපාධිධාරියෙකු වෙනුවෙන් රු.1,198,254 ක පමණ පිරිවැයක් මාණ්ඩලික විද්‍යාලය විසින් දරා තිබුණු අතර 2010 වර්ෂයේ දී එක් උපාධිධාරියෙකු වෙනුවෙන් රු.1,272,551 ක වියදමක් දරා තිබුණි.

4.2 හඳුනාගත් පාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මාසික ජල බිල්පත් සඳහා ගෙවීම් කිරීමේ දී නියමිත දිනයන් වලදී ගෙවීම් සිදුකර වට්ටම් සහන ලබාගැනීමට හැකියාව තිබිය දී 2011 ජනවාරි මාසයේ සිට 2011 දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදයට අදාල ජල බිල්පත් නියමිත දිනවල දී නිරවුල් කිරීමට අපොහොසත්

වීම හේතුවෙන් රු.66,667 ක වට්ටමක් ලබාගැනීමට විද්‍යාලයට තිබුණු හැකියාව අහිමිකර ගෙන තිබුණි.

(ආ) මාසික විදුලි බිල්පත් ගෙවීමේ දී බිල්පතේ සඳහන් නියමිත දිනයට පෙර ගෙවීම් කිරීමට කටයුතු නොකිරීම නිසාවෙන් 2011 වර්ෂය තුළ රු.45,345 ක මුදලක් දඩ මුදල් ලෙස ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවා තිබුණු බව විගණනයට නිරීක්ෂණය විය.
ඉහත ඡේද 2 ක සම්බන්ධයෙන් මු.රෙ.210(1) සහ 210(2) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාර සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඑඩ් 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අංක 5.1 ඡේදය ප්‍රකාර සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එහි ඇතුලත් දෑ ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5:2 ප්‍රසම්පාදන සැලැස්ම

2006 පෙබරවාරි 28 දිනැති අංක එස්පී/එත්පීපී දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

6. පද්ධති හා පාලනය

විගණනයේ දී නිරීක්ෂණය වූ පහත සඳහන් දුර්වල පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(අ) ජංගම නොවන වත්කම් ගිණුම් ගත කිරීම

(ආ) වියදම් පාලනය

(ඇ) ජල සහ විදුලි බිල්පත් ගෙවීම

එච්.ඒ.එස් සමරවීර
විගණකාධිපති


## කාර්ය සාධක දර්ශකය (Key Performance Indicator )

| අ/අංකය S/No | කාර්ය සාධක දර්ශකය (Key Performance Indicator ) | කාර්ය සාධක මිණුම් (Measurement) | ලගා වු ඉලක්කයන් (Target/Milestone reached) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 01 | අධ්‍යාපනික දර්ශකයන් (Academic Indicator).<br><br>අ. ශිෂ්‍ය සහභාගිත්ව දර්ශකය. (Student Participation Indicator) | අ. ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය සහභාගිත්වය 120 දක්වා වර්ධනය කිරීම. | අ. 2010 වර්ෂය තුල ශිෂ්‍ය සහභාගිත්වය 72 වු අතර එය 2011 වර්ෂයේදි ශිෂ්‍යයින් 82 දක්වා වර්ධනය විය. |
| | | ආ. මාණ්ඩලික පාඨමාලාව සමත් වීම ප්‍රතිශතය උපරිමය දක්වා වර්ධනය කිරීම. | ආ. 2010 වර්ෂය තුල ශිෂ්‍ය සමත් වීම 74 වු අතර 2011 වර්ෂයේදි එය 84 දක්වා වර්ධනය විය. |
| | | ඇ. ආරක්ෂක විද්‍යාවේදි (M Def S) හිමිගැන්වීම ප්‍රතිශතය ක්‍රමිකව වර්ධනය කිරීම. | ඇ. 2010 වර්ෂය තුල හිමිගැන්වීම ශිෂ්‍යයින් 37 වු අතර 2011 වර්ෂයේදි එය 44 දක්වා වර්ධනය විය. |
| | | ඈ. විදේශ ශිෂ්‍ය සහභාගිත්වය ක්‍රමවත්ව වර්ධන කිරීම. | ඈ. 2010 වර්ෂය තුල සහභාගි වු විදේශ ශිෂ්‍යයන් සංඛ්‍යාව 05 වු අතර, 2011 වර්ෂයේ දි එය 08 දක්වා වර්ධනය විය. |


01. **අධ්‍යාපනික දර්ශකයන්. (Academic Indicator)**

අ. ශිෂ්‍ය සහභාගිත්ව දර්ශකය (Student Participation indicator).


(1) ත්‍රිවිධ හමුදා ශිෂ්‍ය සහභාගිත්ව වර්ධන වීම.




(2) <u>මාණ්ඩලික පාඨමාලාව සමත් වීම</u>.




(3) <u>ආරක්ෂක විද්‍යාවේදි (M Def S) හිමි ගැන්වීම</u>.





(4) <u>විදේශිය ශිෂ්‍ය සහභාගිත්ව වර්ධන වීම</u>.




| අ/අංකය S/No | කාර්ය සාධක දර්ශකය (Key Performance Indicator ) | කාර්ය සාධක මිණුම් (Measurement) | ලගා වු ඉලක්කයන් (Target/Milestone reached) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඇ) |
| 02 | <u>අධ්‍යාපනික සංවර්ධන දර්ශකය (**Academic Development Indicator**)</u>**.** | | |
| | අ. පුස්ථකාල පහසුකම් සංවර්ධන දර්ශකය (Library Facility Development Indicator ) | අ. පරිශිලනය කරන ලබන පොත් හි ගුණාත්මකව සහ ප්‍රමාණාත්මකව වර්ධනය කිරිම. | අ. 2010 වර්ෂය තුල පැවැති පොත් ප්‍රමාණය පොත් 200 කින් වැඩි කිරිම හා සමස්ත පුස්තකාල කටයුතු පරිඝණක ජාල ගත කිරිම. |
| | ආ. උපාංග වර්ධන දර්ශකය (Equipments acquirement Indicator) | ආ. පුහුණු විම් කටයුතු සඳහා ඉදුරාම අවැසි නව උපාංගයන් ප්‍රමානාත්මකව සහ ගුණාත්මකව වර්ධනය කිරිම. | ආ. 2011 වර්ෂය තුලදි විද්‍යාලය වෙත පුහුණු කටයුතු සඳහා ඉදුරාම අවැසි පහත සඳහන් මුලධන භාණ්ඩ මිලදි ගන්නා ලදි.<br><br>පර්ඝණක - 38<br>පරිඝණක මුද්‍රණ යන්ත්‍ර - 10<br>මල්ටිමිඩියා ප්‍රොජෙක්ටර් යන්ත්‍ර - 05<br>හෙවි ඩියුටි ජායාස්ථ පිටපත් යන්ත්‍ර - 01<br>ඩිජිටල් ඩුප්ලිකේටර් යන්ත්‍ර - 01<br>පරිඝණක මේස - 12<br>පරිඝණක පුටු - 12<br>පොත් අල්මාරි - 06<br>මේස - 19<br>සැලසුම් ඇඳිම සඳහා භාවිතා කරනු ලබන මේස - 10<br>ෆයිල් කැබිනට් - 04 |

02. **<u>අධ්‍යාපනික සංවර්ධන දර්ශකය.</u>**
**<u>(Academic Development Indicator)</u>.**

අ. <u>පුස්ථකාල පහසුකම් සංවර්ධන වීම.</u>




ආ. **<u>උපාංග වර්ධන දර්ශකය.</u>**
**<u>(Equipments acquirement Indicator)</u>.**




| අ/අංකය S/No | කාර්ය සාධක දර්ශකය (Key Performance Indicator ) | කාර්ය සාධක මිණුම් (Measurement) | ලගා වු ඉලක්කයන් (Target/Milestone reached) |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඇ) |
| **03** | **යටිතල පහසුකම් සහ විද්‍යාලිය පහසුකම් සංවර්ධන දර්ශකයන්**<br>**(Infrastructure and facility Development Indicator)**<br>**2011 වර්ෂය.**<br><br>අ. ශිෂ්‍ය නිළධාරි විවාහක නිළ නිවස්න ගොඩනැගිලි 3 ක් ඉදිකිරීම.<br><br>ආ. සිව්මහල් සින්ඩිකේට් ගොඩනැගිල්ල (අදියර 3 කින් නිම කිරීමට සැලසුම් කර ඇත).<br><br>ඇ. අන්තර්ජාල පහසුකම් ලබා දිම හා පරිඝණක ජාල ගත කිරීමට අවැසි කටයුතු සිදු කිරීම.<br><br>ඈ. ද්විත්ව මාර්ගය ඉදිකිරීම (අදියර 2 කින් නිම කිරීමට සැලසුම් කර ඇත).<br><br>ඉ. විද්‍යාලිය අභ්‍යන්තර මාර්ග කාපට් අතුරා නවිකරණය කිරීම (අදියර II). | අ. 2011 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රථම නිම කල යුතුයි.<br><br>ආ. 2012.12.31 දිනට ප්‍රථම නිම කල යුතුයි.<br><br>ඇ. 2016.12.31 දිනට ප්‍රථම නිම කල යුතයි.<br><br>ඈ. 2011.12.31 දිනට ප්‍රථම නිම කල යුතුයි.<br><br>ඉ. 2011.12.31 දිනට ප්‍රථම නිම කල යුතුයි. | අ. විවාහක නිවාස ඉදිකිරීමෙහි පළමු අදියර 2011.12.22 නිම කර ඇත.<br><br>ආ. 2011 වර්ෂය තුල ඉදිකිරීම් වලින් 10% නිම කර ඇත.<br><br>ඇ. 2011 වර්ෂය තුල ව්‍යාපෘතියෙන් 45% නිම කර ඇත.<br><br>ඈ. 2011 වර්ෂය තුල ඉදිකිරීම් වලින් 40% නිම කර ඇත.<br><br>ඉ. 2011 වර්ෂය තුල ඉදිකිරීම නිම කර ඇත. |

03. යටිතල පහසුකම් සහ විද්‍යාලිය පහසුකම් සංවර්ධන දර්ශකයන්.
**(Infrastructure and Facility Development Indicator).**


අ. **ශිෂ්‍ය සුභසාධක පහසුකම් සංවර්ධනය විම.**

උදා- විවාහක නිවාස





ආ. **<u>අධ්‍යාපනික යටිතල පහසුකම් සංවර්ධනය විම.</u>**

උදා- ශිෂ්‍ය නිළධාරි පංතිකාමර ගොඩනැගිල්ල



ඇ. **විද්‍යාලිය යටිතල පහසුකම් සංවර්ධනය වීම.**

උදා- අභ්‍යන්තර මාර්ග පද්ධතිය



## මධ්‍ය කාලීන ආයෝජන සැලැස්ම

1. මෙම විද්‍යාලයේ පවත්වනු ලබන මාණ්ඩලික පාඨමාලාව සඳහා සහභාගී වන ශිෂ්‍ය නිලධාරීන් ප්‍රමාණය වාර්ෂිකව වැඩිකර 2016 වර්ෂයේදී ශිෂ්‍ය නිලධාරීන් 120 ක් දක්වා සහභාගිකරවා නියමිත පුහුණුවීම් සිදු කිරීමට සැලසුම්කර දැනට විද්‍යාලයේ ක්‍රියාකාරී සැලස්මට අනුව 2011 වර්ෂයේදී පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාවට නන්වන ලදි.

(අ) **ද්විත්ව මාර්ගය ඉදිකිරීම රු. 2,874,409.00 යි.**

මෙම විද්‍යාලය සතු ඉඩකඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ බැවින් ජාතික තරුණ සේවා සභාව වෙතින් පවරා ගන්නා ලද ඉඩමෙහි දැනට විද්‍යාලයෙහි වාර්ෂිකව පවත්වනු ලබන මාණ්ඩලික පාඨමාලාව සඳහා සහභාගී වන ශිෂ්‍ය නිලධාරීන්ගේ නේවාසික පහසුකම් වෙනුවෙන් වූ විවාහක නිවාස ඉදිකර ඇත. ඒ අනුව විද්‍යාලය පිහිටි භූමිය හා ජාතික තරුණ සේවා සභාව වෙතින් පවරා ගන්නා ලද ඉඩම් කොටස මැදිව පිහිටි මඩ කුඹුර හරහා ගමනා ගමන පහසුකම් විධිමත්ව සපුරාදීම වෙනුවෙන් නව ද්විත්ව මාර්ගයක් ඉදිකිරීමට කටයුතු කර ඇති අතර, එහි කාපට් ඇතිරීමේ කටයුතු සිදුකිරීමට පමණක් ඇත.

(ආ) **අභ්‍යන්තර මාර්ග පද්ධතිය නවීකරණය කිරීම රු.10,685,750.00 යි.**

විද්‍යාලය වෙත නිරන්තරයෙන්ම පැමිණෙන දේශීය සහ විදේශීය ත්‍රිවිධ හමුදාපතිවරුන් මෙන්ම ප්‍රභූවරුන් හට විද්‍යාල භූමිය දැකබලා ගැනීම වෙනුවෙන් ගමන් ගන්නා අභ්‍යන්තර මාර්ග පද්ධතිය 2011 වර්ෂයේදී නවීකරණය කිරීමට කටයුතු කර දැනට මෙහි සියලුම නවීකරණ කටයුතු සම්පූර්ණ කර ඇත.

(ඇ) **ශිෂ්‍ය නිලධාරී විවාහක නිවාස ඉදිකිරීම රු. 84,000,000.00 යි.**

මාණ්ඩලික පාඨමාලාව සඳහා වාර්ෂිකව වැඩිවූ ශිෂ්‍ය නිලධාරීන් ප්‍රමාණයට අනුව 2011 වර්ෂයේදී අවශ්‍ය විවාහක නිවාස ගොඩනැගිලි 03 ක් ඉදිකිරීමට කටයුතු කර දැනට පාඨමාලාව සඳහා සහභාගී වන ශිෂ්‍ය නිලධාරීන්ගේ නේවාසික පහසුකම් වෙනුවෙන් ලබා දී ඇත.

(ඈ) **සිව් මහල් සින්ඩිකේට් (Syndicate) ගොඩනැගිල්ල ඉදිකිරීම රු. 4,206,592.00 යි.**

මාණ්ඩලික පාඨමාලාව සඳහා සහභාගී වන දේශීය සහ විදේශීය ශිෂ්‍ය නිලධාරීන්ගේ පංති කාමර දේශණ ශාලා ශ්‍රවණාගාර සහ වැලි නිර්මාණ සහිත ආකෘති කාමර පහසුකම් සපයාදීම වෙනුවෙන් ඉදිකරනු ලබන මෙම සිව් මහල් ගොඩනැගිල්ලේ පලමු අධියරේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ අතර, 3 වන අධියරේ ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට නියමිතව ඇත.

(ඉ) **ටෙනිස් ක්‍රීඩා පිටිය නවීකරණය කිරීම රු. 994,875.00 යි.**

මාණ්ඩලික පාඨමාලාව සඳහා සහභාගී වන ශිෂ්‍ය නිලධාරීන්ගේ ක්‍රීඩා පහසුකම් වෙනුවෙන් 2011 වර්ෂයේදී ටෙනිස් ක්‍රීඩා පිටිය නවීකරණ කටයුතු සම්පූර්ණ කර ශිෂ්‍ය නිලධාරීන්ගේ ක්‍රීඩා පහසුකම් සපුරාදීමට කටයුතු කර ඇත.

(ඊ) **ආපනශාලාව ඉදිකිරීම රු. 985,177.00 යි.**

පාඨමාලාව සඳහා සහභාගී වන ශිෂ්‍ය නිලධාරීන්ගේ හා නිත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරී / සෙසු නිලයින්ගේ සුභ සාධක පහසුකම් වෙනුවෙන් අංග සම්පූර්ණ ආපනශාලාව ඉදිකර එමගින් සියලු අයවලුන්ගේ සුභ සාධක කටයුතු සපුරා ගැනීමට කටයුතු කර ඇත.

(උ) **යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම රු. 5,340,971.71 යි.**

2011 වර්ෂයේ විද්‍යාලයේ අවශ්‍යතාවයන්ට අනුව ඉහත මුදල් ප්‍රතිපාදනයන්ට අනුව අත්‍යාවශ්‍ය වූ යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීමට කටයුතු කර ඇත.

(ඖ) **<u>ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම රු. 7,471,655.65 යි.</u>**

2011 වර්ෂයේදී ශිෂ්‍ය නිලධාරීන්ගේ නේවාසික පහසුකම් වෙනුවෙන් ඉදිකරනු ලැබූ නව විවාහක නිවාස සඳහා අවශ්‍ය ගෘහ උපකරණ මිලදී ගැනීම සහ විද්‍යාලයේ කාර්යාල ප්‍රයෝජනය සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ ඉහත මුදල් ප්‍රතිපාදන මත මිලදී ගැනීමට කටයුතු කර ඇත.

(ඵ) **<u>පරිගණක උපාංග මිලදී ගැනීම රු. 3,101,275.20 යි.</u>**

පාඨමාලාව සඳහා සහභාගී වී සිටි ශිෂ්‍ය නිලධාරීන් ප්‍රමාණයට අනුව ප්‍රමාණවත් පරිගණක උපකරණ මිලදී ගැනීමට කටයුතු කර තිබූ අතර, ඒ සඳහා අවශ්‍ය පරිගණක උපාංග මිලදී ගැනීම වෙනුවෙන් ඉහත මුදල් ප්‍රතිපාදන වැය කිරීමට කටයුතු කර ඇත.

2011 විගණකාධිපති වාර්තාව සහ එහි නිරීක්ෂණයන් සඳහා ගනු ලැබූ නිවැරදි කිරීම් පියවර හා වර්තමාන තත්වය

| ඡේද අංකය | නිරීක්ෂණය | නිවැරදි කිරීමට ගත් පියවර | වර්තමාන තත්වය |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඇ) |
| 2.2 (I) | 1978 දෙසැ. 19 දිනැති අංක 842 දරණ චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් තිබුණි. | විද්‍යාලයේ සියලුම ස්ථාවර වත්කම් ඇතුලත් කරමින් නියමිත ආකෘතියට අනුව පිළියෙළ කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කිරීමට කටයුතු කරන ලදි. | ස්ථාවර වත්කම් ලේඛනය පිලියෙල කර රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය හා විගණකාධිපති දෙපාර්තමෙන්තුවට 2013.03.18 දින පිටපත් ඉදිරිපත් කර ඇත. |
| 2.2 (II) | අංක 01/2004 සහ 2004 පෙබ. 24 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | එක් එක් වර්ෂයන් සඳහා වූ වාර්ෂික කාර්ය සාධන වාර්ථා ඇතුලත් කරමින් වාර්ෂික වාර්ථා පිළියෙල කර ඇත. | 2010 වර්ෂය සඳහා වූ වාර්ෂික කාර්ය සාධනයද ඇතුලත් වාර්ෂික වාර්තාව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය වෙත ඉදිරිපත් කර ඇති අතර 2011 වාර්ෂික වාර්තාව කළමණාකරණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කර ඇත. |
| 3.2 (ඊ) | නඩත්තු වියදම රු. 10,437,368 හෙවත් 133.12% කින් වැඩිවීම. | නඩත්තු වියදම පහත කරුණු හේතුවෙන් වැඩිවී ඇත.<br><br>1. විද්‍යාලයේ කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය නිලධාරීන් වැඩිවීමට සාපේක්ෂව ගොඩනැගිලි නඩත්තු වියදමද ඉහලයාම.<br><br>2. විද්‍යාලය සතුව පවත්නා පැරණි වාහන සංචිතය නඩත්තු කිරීම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවේ.<br><br>3. යන්ත්‍ර උපකරණ ගෘහ භාණ්ඩ හා පරිගණක නඩත්තුව සඳහා වූ වියදම 2010 ට සාපේක්ෂව ඉහලයාම. | එක් එක් වියදම් වර්ගයක් සඳහා වූ වාචික වියදම් සීමා පැනවීම මගින් වියදම් පාලනය කිරීමට කටයුතු කර ඇත. |
| 4.1 (අ) | මාණ්ඩලික විද්‍යාලය මෙහෙයවනු ලබන උපාධි පාඨමාලාවට සහභාගී වන සිසුන් සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේදී නවයකින් ඉහල ගොස් තිබුණි. | වර්ථමාන ඉල්ලුමට සාපේක්ෂව බඳවාගන්නා ශිෂ්‍ය නිලධාරීන්ගේ සංඛ්‍යාව වාර්ෂිකව ඉහල නන්වා ඇත | 2011 වර්ෂයේදී 83ක්වූ ශිෂ්‍ය නිලධාරීන්ගේ සංඛ්‍යාව 2012 සහ 2013 වර්ෂයන් හිදි පිළිවෙලින් 103ක් හා 106ක් ලෙස වැඩිවී ඇත. |
| 4.1 (ආ) | ආදායම් හා වියදම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂයේදී එක් උපාධි ධාරියෙකු වෙනුවෙන් රු. 1,198,254 ක පමණ පිරිවැයක් මාණ්ඩලික විද්‍යාලය විසින් දරා තිබුණු අතර 2010 වර්ෂයේදී එක් උපාධිධාරියෙකු වෙනුවෙන් රු. 1,272,551 ක වියදමක් දරා තිබුණි. | 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂය තුළදී එක් ශිෂ්‍ය නිලධාරියෙකු සඳහා වූ වියදම අඩුවී ඇත. | |

| ජේද අංකය | නිරීක්ෂණය | නිවැරදි කිරීමට ගත් පියවර | වර්තමාන තත්වය |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 4.2 (ආ) | මාසික විදුලි බිල්පත් ගෙවීමේ දි බිල්පතේ සඳහන් නියමිත දිනයට පෙර ගෙවීම් කිරීමට කටයුතු නොකිරීම නිසාවෙන් 2011 වර්ෂය තුළ රු. 45,345 ක මුදලක් දඩ මුදල් ලෙස ලංකා විදුලි බල මණ්ඩලය වෙත ගෙවා තිබුණි. | 2011 වර්ෂයේ විද්‍යාලය සඳහා ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය හා ඒ අනුව, භාණ්ඩාගාරය විසින් මාසිකව නිදහස් කරනු ලබන මුදල් පුද්ගල පඩි නඩි හා අත්‍යවශ්‍ය සේවා සඳහා වියදම් කිරීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් විදුලි බිල්පත් නියමිත දිනයන් වලදී නිරවුල් කිරීමට නොහැකි වී ඇත. | මේ වන විට අදාල තත්වය නිවැරදි කරගෙන ඇත. අදාල මේ වන විට අදාල තත්වය නිවැරදි කරගෙන ඇත. අදාල බිල්පත් ප්‍රමුඛතා පදනම මත ගෙවීම මගින් 2012 වර්ෂයේ කිසිදු දඩ මුදලක් ගෙවා නොමැත. |
| 5.1 | 2003 ජුලි 02 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අංක 5.1 ජේදය ප්‍රකාර සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද එහි ඇතුලත් දෑ ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | 2011 වර්ෂය සඳහා විද්‍යාලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කර ඇත. | 2011 වර්ෂයේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශයට ඉදිරිපත් කර ඇත. |
| 5.2 | 2006 පෙබරවාරි 28 දිනැති අංක එස්පීඑන්පීඒ දරණ ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයේ 2 ජේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2011 වර්ෂය සඳහා විද්‍යාලය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කර ඇත. | 2011 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශයට ඉදිරිපත් කර ඇත. |